# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,863 — 1969 ජුලි 18 වැනි සිකුරාද — 1969.7.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 1211 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | 1250 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 1222 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 1232 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | 1248 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | — |
| බඩු බාහිරාදිය විකිණීම | 1249 | විවිධ දැන්වීම් | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත් නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේය.

**සංලක්‍ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**— මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය හින්නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දැතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරනලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණුම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒ. 94/එක්ස්. 2114/68.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### කලා හා කලා ශිල්ප විද්‍යාලයේ විද්‍යාලයාධිපති තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයේ විද්‍යාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත් : 1969 අගෝස්තු මස 1 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත් : 1969 අගෝස්තු මස 8 වැනිදා.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දවූද, මුද්දර නොගැසුවා වූද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන් ගේ කායාංශලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කායාංශලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මෙය ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත තනතුරකි. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අඩු කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන නිලධාරියා එවකටත් රාජ්‍ය සේවයේ සිටින්නකු නම්, අවුරුද්දකට මේ තනතුරේ වැඩ බලන ලෙස ඔහුට නියම කරනු ඇත. ඔහුගේ සේවය සතුටුදායක බවක් නො පෙනුනොත්, වැඩ බලන කාලය තුළ කවර විටෙක හෝ ඒ කාලය අවසානයේදී හෝ ඔහු, ඔහුගේ මුල් තනතුරට හරවා යවනු ලැබීමට යටත් වේ.

(iii) තෝරා ගනු ලබන නිලධාරියා රාජ්‍ය සේවයේ නියුක්ත වූවෙකු නොවේ නම් ඔහු පත් කරනු ලබන්නේ තුන් අවුරුදු පරීක්ෂණ කාලයක් පිටය. පරීක්ෂණ කාලය සතුටු දායක ලෙස නිම කළ පසු ඔහුගේ පත්වීම තහවුරු කරනු ඇත.

(iv) ස්ථිර ලේකම් තුමා විසින් නියම කරනු ලැබුවහොත්, නියම කෙරෙන පරිදි රජයේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත අනුව ඇප ඉදිරිපත් කිරීමට බැඳිය යුතුය.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය රු. 8,400—480×6—11,280 වේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969.8.1 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 50 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ කලායතනයක උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් සහ/හෝ පිළිගත් විදේශීය කලා යතනයකින් ලැබූ අවුරුදු 3 කට නො අඩු පුහුණුවක් හෝ සමාන සුදුසුකම් ලබා තිබිය යුතුය.

(ඊ) පිළිගත් ආයතනයක හෝ විද්‍යාලයක අවුරුදු 5 ට නො අඩු පරිපාලන පළපුරුද්දක් සහිතව, ප්‍රකට කලා කරුවෙකු මූර්ති ශිල්පියෙකු හෝ මෝස්තරකරුවෙකු වශයෙන් අවුරුදු 10 කට නො අඩු ප්‍රායෝගික පළපුරුද්දක් සහ/හෝ ඉගැන් වීමේ පළපුරුද්දක් තිබිය යුතුයි.

(උ) කලා හා කලා ශිල්ප පිළිබඳව විශිෂ්ඨ හැකියාවක් හා අත් දැකීමක් තිබිය යුතුය. මෙරට දී මෙන්ම පිටරටදීත් සාර්ථක කලා ප්‍රදර්ශන පවත්වා ඇති අයට විශේෂ සැලකිලි දක්වනු ලැබේ.

(ඌ) ලෝකයේ අග්‍රගන්‍ය කලා භවන්, කලා මධ්‍යස්ථාන හා කලා විද්‍යාලයන්ගේ ආශ්‍රය ලබා තිබීම අතිරේක සුදුසුකමකි.

(එ) දේශීය කලා, කලා ශිල්ප හා ඉතිහාසය පිළිබඳ පුළුල් දැනීමක් අවශ්‍ය ය.

**සටහන.**—" ඉහත සඳහන් සියලුම සුදුසුකම් ඇති අපේක්ෂකයින් නොසිටිත් නම් විශිෂ්ඨ සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් (ඊ) දරණ ඡේදයෙහි සඳහන් 5 අවුරුදු පරිපාලන පළපුරුද්ද නොමැති වුවද, අන් සුදුසුකම් ඇත්නම්, සලකා බලනු ලැබේ."

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(i) උප්පැන්න සහතිකය—(සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාර ගනු නො ලැබේ).

(ii) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(iii) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්.

(iv) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(v) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි :**

(i) අයදුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයින් ගේ අයදුම් පත්‍ර සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරු විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් (3) ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුන බවට දැන්වීමක් නො ලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධාන ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969.7.11 වැනි දින,
කොළඹ, තැ. පෙ. අංක 500,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායාීලයේදී ය.

7–836/1—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 60/එක්ස්. 2115/69

## පළාත් පාලන අමාත්‍යාංශයේ, නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ, ආධුනික නගර නිර්මාණ සහකාර තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ ආධුනික නගර නිර්මාණ සහකාර තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායාීලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර.—1969 අගෝස්තු මස 1 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර.—1969 අගෝස්තු මස 8 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම්පත් පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්ද වූද, මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතු වෙයි.

**2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරීක්ෂණ කාලයකට යටත්වනු ඇත.

(ii) නගර නිර්මාණය සම්බන්ධයෙන් පුහුණුවක් ලැබීම සඳහා ඔවුන්ට විදේශයකට යෑමට ඉඩ ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය. වර්ෂයකට රු. 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 6 කින් රු. 6,240 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් ය.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළයුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 කට නොවැඩි බවය. දැනට මත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙම වයස් සීමාව බල පාන්නේ නැත.

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ පිළිබඳ ගෞරව උපාධිධරයකු බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) **උප්පැන්න සහතිකය** (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිද් උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහා චාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතකට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලිය කියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවනලද ("බී" සලකුන දරණ) මුද්‍රිත තැපැල්පත මේ සමඟ භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට නිකුත් කරනලද ("ඒ" සලකුන දරණ) මුද්‍රිත තැපැල්පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති 3 ක් ඇතුලත තම ඉල්ලුම්පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සළකා බැලීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 11 දින,
කොළඹ 1,
තැ. පෙ. 500,
ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

7–836/2—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී 62/එක්ස් 2116/69

## තැපැල් හා විදුලිසන්දේශ දෙපාර්තමේන්තුව

### සන්දේශ හා මුදල් නිලධාරි තනතුර

### විදේශ විදුලිසන්දේශ සේවය

තැපැල් හා විදුලිසන්දේශ දෙපාර්තමේන්තුවේ විදේශ විදුලි සන්දේශ සේවයේ සන්දේශ හා මුදල් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(අ) ප්‍රාදේශීය අයදුම්පත් 1969 අගෝස්තු මස 1 වැනිදා

(ආ) විදේශීය අයදුම්පත් 1969 අගෝස්තු මස 8 වැනිදා

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන් මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු ආධුනික කාලයක් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

දළ වශයෙන් මාස 6ක පමණ වූ විදේශ පුහුණුවක් සළසා දෙනු ලැබේ. විදේශය බලා පිටත්ව යාමට පළමු, ලංකාවේ තැපැල් හා විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අදාළ ශාඛාවන්හි කටයුතු පිළිබඳව මාස තුනක පමණ කාලයක පළපුරුද්දක් ලබාගැනීමට නිලධාරියාට සිදුවේ.

පිටරට පුහුණුවීම සම්බන්ධයෙන් දීමනා ආදිය එකලට ක්‍රියාත්මකව පවත්නා ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ. එවැනි පුහුණුවකට යාමට පෙර අයදුම්කරුවා ලංකාණ්ඩුව සමග පහත සඳහන් පරිදි ගිවිසුමකට බැඳිය යුතුයි.

(i) වෙනත් කරුණු ඉටුකිරීමටත් නියම කරන ලද පුහුණුවීමේ පාඨමාලාව විශ්වාසවන්තව සහ උද්‍යෝගයෙනුත් අනුගමනය කරන බව හා පුහුණුව සතුටුදායක ලෙස අවසන් කරන බවටත්. එසේ පුහුණුව අවසන් කිරීමෙන් පසු නිර්දිෂ්ඨ කාලයක් (මෙය රජය විසින් තීරණය කරනු ලැබේ.) ලංකාණ්ඩුවට සේවය කිරීමටත් බැඳී සිටීම.

(ii) ගිවිසුමේ කොන්දේසි සපුරාලීමට නොහැකි වුවහොත් පාඨමාලාව සම්බන්ධ වැය වූ මුළු මුදල එනම්, ලංකාණ්ඩුව සහ /හෝ වෙන යම් ප්‍රදානය කරන සංස්ථාවක් විසින් වැය කරන ලද මුළු වියදම (එනම්, වැටුප්, දීමනාවන්, නැව් ගාස්තු, ගාස්තු ගෙවීම ආදිය) ආපසු ගෙවීමට බැඳී සිටීම.

**3. වැටුප හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය.—වර්ෂයකට රුපියල් 4,080—12×360 සහ 10×480—රු. 13,200 (වර්ෂයකට රු. 8,400 සහ රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් හා රු. 11,280 දී දෙවර්ෂයක නැවතීමක් ද සහිතයි.)

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1969. 8. 1 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි බව, (දැනටමත් රජයේ සේවයේ නියුතුව සිටින්නන් කෙරෙහි මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලත්,

(අ) සංඛ්‍යාති හෝ ගණකාධිකරණය සමග ආර්ථික විද්‍යා උපාධියක් හෝ

(ආ) භෞතික විද්‍යාව, ගණිතය පිළිබඳ විද්‍යාවේ දී (විශේෂ) උපාධිය හෝ

(ඈ) ගණිතය හා භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇති 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ

(ඈ) එංගලන්තයේ හෝ, ලංකාවේ වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ හෝ එක්සත් රාජධානියේ සංස්ථාවරලත් ගණකාධිකරු සංගමයේ හෝ ලංකා ගණකාධිකරු මණ්ඩලයේ හෝ ලංඩන්හි සහතික කළ සහ ඒකාබද්ධ ගණකාධිකාරී කමිටුවේ අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථයක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහ තික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු. (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ හයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරනු ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝරමය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඞී. ආර්. එල්. බාලසූරිය.
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූලි මස 11 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

7–836/3—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

### සහකාර වැඩ මූලික (විදුලි) තනතුර

රාජකීය ලංකා නාවික හමුදාවේ සහකාර වැඩ මූලික (විදුලි) තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 1,860—120—3,780.

2. **අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ගණිතය විෂයයක් සහිතව කණිෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ උසස් විභාගයකින් හෝ සමත්විය යුතුය.

(ආ) පිළිගත් විදුලි ඉංජිනේරු ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු 5 ක වෘත්තීය ආධුනික සේවා කාලයක් සාර්ථක අන්දමින් සම්පූර්ණ කර පරිපාලන ධූරයක අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්,

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨ මාලාවක් හෝ සාර්ථක අන්දමින් සම්පූර්ණ කර, පරිපාලන ධූරයක යටත් පිරිසෙයින් අවුරුදු 2 ක් වත් සේවය කර තිබිය යුතුය.

සහ

(ඈ) පහත සඳහන් කරුණුවලට අදාලව, පරිපාලන ධූරයක අවුරුද්දක් ඇතුළුව යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුය :—

(i) කිලෝවෝට් II තෙක් බල ප්‍රමාණයක් (වෝල්ට් ගණන) භාවිතා කෙරෙන අධිබල (හයිවෝල්ටේජ්) විදුලි සම්පාදන බෙදා හැරීමේ ක්‍රමවල අවශ්‍යතාවයන්, පිළිබඳ මනා අවබෝධයක් තිබීම,

(ii) ඉහළින් සහ පොළව යටින්ද අධි බල සහ අඩුබල සම්ප්‍රේෂණ න්‍යායයන් මෙන්ම ඒ හා සම්බන්ධිත රෙගුලාසි සහ අනතුරු වැළැක්වීමේ ක්‍රම පිළිබඳව මනා දැනීමක් තිබීම.

(iii) අළුත් ඉදිකිරීම් සම්බන්ධ විධානය හා පරිපාලනයද දැනට පවත්නා ස්ථාපනයන්ගේ නඩත්තුවද කළ හැකිවීම, ඇදීම සහ අවසන් කිරීම (කිලෝවෝල්ට් ඇම්පියර් 500 දක්වා වූ) පරිනාමවක ස්විච් ආම්පන්න ආරක්ෂක හා ඒ හා සම්බන්ධ වෙනත් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ දැනුම මීට ඇතුළත්ය.

3. **අවශ්‍ය වෙනත් සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම්ද ලබා ඇති බවට සෑම අයදුම්කරුවෙක්ම සාක්ෂි සැපයිය යුතුය :—

වයස : (අ) 1969.7.1 දිනට වයස අවුරුදු 25 කට නොඅඩු හෝ 35 කට නොවැඩි හෝ විය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

(ආ) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් සමන්විතවීම.

4. **සේවා නියමයෝ :**

(අ) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත එකකි. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) තෝරාගත් අයදුම්කරු කෙටිකාල දැන්වීමකින් රාජකාරී භාර ගත යුතුවාක් මෙන්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ද සූදානම්ව සිටිය යුතුය. දැනට කොළඹ, ත්‍රිකුණාමලය, දියතලාව, කල්පිටිය හා කරෙයිනගර් යන ස්ථානයන්හි නාවික හමුදා ආයතනයක් පිහිටුවා ඇත.

5. ලංකාවේ පිහිටි එක්සත් රාජධානි කඳවුරු ආපසු ලංකාවට පවරා ගැනීමේ හේතුවෙන් ලංකාවේ එක්සත් රාජධානි සේවාවන්හි නියුක්තව සිටි 1956 ජූලි 6 දා හෝ ඊට පසු දිනක අස් කරනු ලැබූ සිවිල් සේවකයන් වෙනුවෙන් පහත සඳහන් පහසුකම් සලසා තිබේ.

(i) **වයස :** නියම කරන ලද උපරිම වයස් සීමාව තුළ සිටීමට ඉඩ ලැබෙන සේ ඔවුන්ගේ වයසෙන් එක්සත් රාජධානි හමුදා සේවා කාලය අඩු කිරීම.

(ii) **අධ්‍යාපනික සුදුසුකම් :** සත්වැන්න සමත්වීම ප්‍රමාණවත් වේ.

(iii) ආධුනික කාලය හා පළපුරුද්ද: ආධුනික කාලයක් අවශ්‍ය නැත. එහෙත් ඊට සරිලන සේ, පළපුරුදු කාලය අවශ්‍ය ආධුනික කාලයට සමාන ප්‍රමාණයකින් දීර්ඝ විය යුතුය.

6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත් වලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා රෙගුලාසි සඳහා නිකුත් කරනු ලබන සහතික භාරගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික.

(ඈ) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනට මත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් චරිත සහතික සැපයීම අනවශ්‍යය.)

7. මෙම ගැසට් පත්‍රිකාවේ I කොටසේ (II) ඡේදයෙහි ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

9. කලින් ලත් පළපුරුද්ද සහ යෙදී සිටි රක්‍ෂාවල් පිළිබඳ විස්තර ඉල්ලා ඇති පරිදි දක්වමින් පහත සඳහන් ආකෘතිපත්‍රයේ අන්දමට සකස් කරගත් අයදුම්පත් (කොළඹ තැ. පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරී සහ ගණකාධිකාරි වෙත) ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "සහකාර වැඩ මූලික තනතුර (විදුලි) සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් ලියා 1969 අගෝස්තු 10 දිනට හෝ ඊට පෙර නාවික හමුදාවේ සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරි වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එ. රෙ. සමරසේකර,
සිවිල් පාලන නිලධාරී හා ගණකාධිකාරී
නාවික හමුදාධිපති වෙනුවට.

1969 ජූලි මස 9 දින,
කොළඹ,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී ය.

### ආදර්ශ අයදුම්පත

**රාජකීය ලංකා නාවික හමුදාව—වැඩ මූලික (විදුලි)**

1. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) :————.
2. ලිපිනය :————.
   (1) කාර්යාලීය :————.
   (2) පුද්ගලික :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. සිවිල් තත්ත්වය :————.
6. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග විෂයයන් සමග යොදන්න) :————.
7. කාර්මික හෝ අනිකුත් සුදුසුකම් :————.
8. ආධුනික, අභ්‍යාස පරිපාටි, පළපුරුද්ද ආදියේ විස්තර :————.
9. පාසැලෙන් අස්වූවාට පසු යෙදුන රක්ෂාවල් සම්බන්ධ විස්තර :————.
10. චරිත සහතික ලබාගෙන ඉදිරිපත් කරන තිදෙනෙකුගේ නම් :————.
    (i)
    (ii)
    (iii)
11. අනිකුත් තොරතුරු :————.

මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති සියළු විස්තර සැබෑ බවත්, නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් යම් කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙක් වන බවද තෝරා ගැනීමෙන් පසු යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් අනාවරණය වූවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත් වන බැව්ද මම හොඳාකාර දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–834—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරු තනතුරු (තාවකාලික)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු තනතුරු (තාවකාලික) සඳහා රැකීරක්ෂා කාර්යාලයේ ලියාපදිංචි වූවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පළකොට ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කළ අයදුම්පත් 1969. 10. 8 වැනි දින හෝ ඊට පෙර හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) වෙත එවිය යුතුයි. අයදුම්පත් ලැබුණු බැව් දන්වනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 960—72×2—රු. 1,104.

**සටහන :**—4(ii) (අ) හා 4(ii) (ආ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඇති සේවාගයින් ඉහත දක්වා ඇති වැටුප් ක්‍රමය මත පිළිවෙලින් වර්ෂයකට රු. 1,032 හා රු. 1,104 ආරම්භක වැටුප් ලැබීමට සුදුස්සෝ වෙති.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(අ) ලාංකිකයෙකු බවටද (පෙලපතින් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලක්දිව පුරවැසියා ලාංකිකයෙකි.),

(ආ) 1969 ජූලි මස 18 වැනි දිනදී වයස අවුරුදු 18 හා 30 අතර බවටද,

(ඇ) ඉතා යහපත් චරිතයකින් යුක්ත බවටද,

සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අධ්‍යාපන සුදුසුකම් :—

(i) ගණිතය විෂයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත්ව විෂයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළෙන් සාමාර්ථය සහ පහත සඳහන් සුදුසුකම් වලින් එකක් තිබිය යුතුයි :—

(ii) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පූර්ණකාල දිවා පාඨමාලාව (සැලසුම්කරු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ, කණිෂ්ඨ කාර්මික නිලධාරි පාඨමාලාව (දෑවුරුදු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම, හෝ

(ඇ) ගොඩනැගිලි නිර්මාණය සඳහා වූ සන්ධ්‍යා හෝ අර්ධකාලීන පාඨමාලාවේ I, II සහ III වැනි කොටස් සාර්ථක ලෙස අවසන් කිරීම.

5. **සේවයෙහි යෙදවීමේ කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. ආධුනික සැලසුම්කරුවන් වශයෙන් පත් කිරීමෙන් පසු දෙවැනි ශ්‍රේණියේ සැළසුම්කරුවන් ලෙස පත්වීම් ලැබීම සඳහා සුදුසුකම් ලබා ගනුවස් ස්වකීය ඉගෙනීමේ කටයුතුවල නියම ලැදියාවකින් නිරතවන බවටද, පුහුණුව අවසන් කිරීමෙන් පසු නියම කරනු ලැබුවහොත්, දෙවැනි ශ්‍රේණියේ සැලසුම්කරුවන් වශයෙන් අවුරුදු පහකට නො අඩු කාලයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටද, තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පුහුණුව පටන් ගැනීමට පෙර දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට බැඳිය යුතුයි. මීට අමතරව පුහුණුව ලබන අය විසින් ගිවිසුමේ කොන්දේසි නිසි අයුරු පිළිපදින බවට, පුහුණුව ලබන අය සහ ඔවුන්ගේ මව්පියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් හෝ ඇපකරුවන් දෙදෙනෙකු සමග දෙපාර්තමේන්තුව නියම කරන මුදලකට බැඳුම්කරයකටද අත්සන් තැබිය යුතුයි.

වැඩ සහ හැසිරීම අසතුටුදායක හෝ නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්ව ඇති හෝ කිසියම් ආධුනික සැළසුම්කරුවෙකු වේ නම් ඔහු සේවයෙන් පහ කරනු ඇත.

6. **සේවා කොන්දේසි :—**

**ආධුනික සැළසුම්කරුවන් පහත සඳහන් පරිදි පුහුණු කරනු ලැබේ.**—4(ii) (අ) හා 4(ii) (ඇ) යටතේ සුදුසුකම් ලබන අය දෙපාර්තමේන්තුවේ දෙවර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුයි.

4(ii) (ආ) යටතේ සුදුසුකම් ලබන අය දෙපාර්තමේන්තුවේ එක් වර්ෂයක පුහුණුවක් ලැබිය යුතුයි. ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත්වීමෙන් පසු අපේක්ෂකයන් II ශ්‍රේණියේ සැළසුම්කරුවන් වශයෙන් පත්කරනු ලැබීමට සුදුස්සෝ වෙති.

7. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත්‍ර සමග පහත දක්වා ඇති සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා ශිල්පමය සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ආ) උප්පැන්න සහතිකය (අධ්‍යාපනික අභිප්‍රායන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.),

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක්—මෙයින් එකක් අයදුම්කරු අවසාන වශයෙන් උගත් පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතුයි.

සැළකිය යුතුයි :—මෙම සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

8. අයදුම්කරුවන් ස්වකීය වියදමින් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුයි.

9. අයදුම්පතේ දී ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරාගනු ලැබීමෙන් පසුව හෝ පෙර හෝ හෙළිදරව් වුවහොත් අයදුම්කරු නුසුදුස් සකු කිරීමටද, සේවයෙන් පහ කිරීමටද සිදුවනු ඇත.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාලවන පොදු කොන්දේසිවලට මෙයින් අවධානය යොමු කරමි.

ඇල්. බී. මාරඹේ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජුලි මස 2 වැනිද,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

## ආධුනික සැළසුම්කරු තනතුරු සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) පෙළපත් නම :————.

(ආ) අනිකුත් නම් :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

(ආ) මොවුන්ගේ උපන් ස්ථානය :—

(i) අයදුම්කරුගේ පියා :————.

(ii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයා :————.

(iii) අයදුම්කරුගේ පිය පක්ෂයේ සීයාගේ පියා :————.
(අයදුම්කරු ලක්දිවහි ඉපදිනි නම් (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය. අයදුම්කරු ඉපදුනේ ලක්දිවහි නොවේ නම් (ආ) (i) හා (ii) හෝ (iii) පිරවිය යුතුයි.)

5. ලබාගත් අධ්‍යාපන සුදුසුකම් :—
(පරීක්ෂණයේ වර්ෂ සහ මාසයද සමත් වී ඇති විෂය යන් හා එක් එක් විෂයෙන් ලත් තත්ත්වයද සඳහන් කළ යුතුය.)

6. ලබාගත් ශිල්පමය සුදුසුකම් :————.

7. අයදුම්කරු විවාහක හෝ අවිවාහක බව :————.

8. අමුනා ඇති චරිත සහතික කාගෙන්ද :—

මේ අයදුම් පතේ මවිසින් සපයා ඇති විස්තර අව්‍යාජ බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————,

දිනය :————.

7–621—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් අයදුම් පත් 1969. 8. 1 දින හෝ ඊට පෙර අලෙවි කිරීමේ කොමසාරිස්, තැ. පෙ. 562, කොළඹ 1 යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

2. වැටුප.—රුපියල් 3,900—8 × 180—5,340 යන වැටුප් ක්‍රමය මෙම තනතුරට අදාලවේ.

3. **සේවා තත්ත්වය.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ සාමාජික මුදල් ගෙවිය යුතුය.

4. **සේවා කොන්දේසි.**—රාජ්‍ය භාෂා පණතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(i) තෝරා ගනු ලබන අයදුම්කරු තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වනු ඇත.

(ii) ඔහු රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් ව්‍යවස්ථාවනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(iii) ආධුනික කාල සීමාව ඇතුළත ඔහු විසින් සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(iv) ආධුනික කාල සීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර නියමිත කාල සීමාවන් ඇතුළතදී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීම ද මත රඳාපවතිනු ඇත. නියමිත කාල සීමාව තුළදී මෙම ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීමට අපොහොසත් වීම, වැටුප් වැඩි වීම අත්හිටුවනු ලැබීමට හේතු වනු ඇති අතර, නියමිත කාල සීමාව ඉක්මවා තවත් සමසක් ඇතුළතදී පරීක්ෂණයකින් සමත් නොවුවහොත්, එම අත්හිටුවීම නතර කිරීමකට පරිවර්ථනය කර, පරීක්ෂණය සමත් වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) ආධුනික කාල සීමාව අවසන් වීමට පෙර, සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවයක් ලබා ගෙන නොතිබුණහොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල විධි විධාන බලපවත්වනු ඇත. (ඉහල දැක්වෙන අංක (iii), (iv), (v) දරණ කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවා ගනු ලබන්නන්ට අදාල වේ).

(vi) තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුළතදී ඔහු සිංහල භාෂා විෂයෙන් නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම විභාගයෙන් සමත් වීමට අපොහොසත් විම වැටුප් වැඩිවීම පමා කරනු ලැබීමට හේතු වනු ඇත.

(vii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් ලංකාවේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය.

(viii) රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ආඥා පණත යටතේ (රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇප කර සංගමය මගින්) රුපියල් 10,000 ක විශ්වාස ඇප ඔප්පුවක් මගින් තෝරා ගනු ලබන නිලධාරියා විසින් ඇප තැබිය යුතුය. තවදුරටත් අවශ්‍ය වෙතොත් ස්ථිර ලේකම් තුමා විසින් නියම කරනු ලබන අන්දමකට ඇප තැබීමට යටත් වන්නෙහිය.

5. වයස.—1969. 8. 1 දිනට වයස අවුරුදු 25 කට අඩු නොවන අතර, අවුරුදු 40 කට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ දැනට ස්ථිර තනතුරු දරන නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

6. **අධ්‍යාපනික සුදුසුකම්.**—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන විභාගයක්,

(ii) (අ) මෝටර් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ අදාල කාර්මික විද්‍යාව පිළිබඳව හෝ පිළිගත් කාර්මික ආයතනයකින් ලබාගත් සහතිකයක් හෝ ඩිප්ලෝමා සහතිකයක්, හෝ

(ආ) මෝටර් රථ කර්මාන්ත ආයතනයේ (ඒකාබද්ධ මණ්ඩලය) ආශ්‍රිත සාමාජිකත්වය, හෝ

(ඇ) ඉතා අඩු වශයෙන් අවුරුදු 15 ක කාර්මික පළපුරුද්දක් තිබීම. මෙයින් ඉතා අඩු වශයෙන් අවුරුදු 6 ක් වත් ගරාජයක හෝ ප්‍රවාහන ආයතනයක වගකිව යුතු පරීක්ෂකවරයෙකු වශයෙන්/පාලක නිලධාරියෙකු

වශයෙන් කටයුතු කර තිබිය යුතු අතර, මෝටර් රථ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව මනා දැනුමක් තිබීම, හෝ

(ඇ) සමාන සුදුසු කම්,

(iii) සියළුම වර්ගයේ කාර් සහ ලොරි පැදවීම සඳහා රියැදුරු බල පත්‍රයක් තිබීම සහ පළමු වන පන්තියේ මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ වැඩපොලක් භාරව කටයුතු කළ බවට සහතික යක්,

(iv) කම්කරුවන් සංවිධානය කිරීමට සහ පාලනය කිරීමට රථ වාහන සමූහයක් නඩත්තු කිරීමට සහ වැඩ පොලෙහි සේවකයන් පරිපාලනය කිරීමට හැකියාවක් තිබීම.

7. සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත පෙනෙන සහතික වල පිට පත් (මුල් පිටපත් නොවේ) තම අයදුම් පතට අමුණා එවිය යුතුයි. මෙම අවශ්‍යතාවය ඉටු කිරීමට අපොහොසත් වීමේ හේතුවෙන් අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබීමට ඉඩ තිබේ :—

(අ) උප්පැන්න සහතික හෝ (උප්පැන්න සහතික ලියා පදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතික (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ),

(ආ) 6 වැනි ඡේදයේ නිර්දේශ කර ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලැබූ සහතික පත්,

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාවය යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබා ගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන් ගෙන් බලාපොරොත්තු නොවේ.)

සැලකිය යුතුයි :—සහතික පත්‍රවල සහ චරිත සහතික වල පිටපත් ආපසු එවනු නොලැබේ.

8. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුනොත් ඒ අයදුම් පත් භාර ගනු ලබන්නේ ඒවා නියමිත දිනට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට ලැබී තිබුණ හොත් ද, ඒවා ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නිර්දේශ කළහොත් ද පමණකි.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් අලෙවි කිරීමේ දෙපාතීමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව, අලෙවි කිරීමේ කොමසාරිස් වෙත එවිය යුතුය.

කේ. බී. දිසානායක,
අලෙවි කිරීමේ කොමසාරිස්.

1969. 7. 9 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

## අලෙවි කිරීමේ දෙපාතීමේන්තුව

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර

1. සම්පූර්ණ නම :—

(අ) පෙළපත් නම :————.

(ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය :————.

4. ජාතිය :————.

5. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නෙහිද ? එසේ නම්—

(i) උත්පත්තියෙන් ද ? :————.

(ii) ලියාපදිංචි වීමෙන් ද ? :————.

6. අධ්‍යාපනික සුදුසුකම් (සමත් වූ විභාග සඳහන් කරන්න) : ————.

7. කාර්මික සුදුසුකම් (සමත් වූ විභාග සඳහන් කරන්න) : ————.

8. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර (දින සහිතව, සත්‍ය හා නිවැරදි විස්තර දැක්විය යුතුයි) :————.

9. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.

10. දැනට රක්ෂාවක් නොකරයි නම් කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම්, ඉන් අස්වීමට හේතුව :————.

12. නිවේදනයේ 7 (ඇ) අනුව සහතික පත්‍ර ලබා ගත් අයගේ නම් සහ තනතුරු :————.

මෙම අයදුම් පතේ සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාව යක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහ කර දමනු ලැබීමට ද හේතු වන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–726—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුර

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**වේතනය.**—වේතනය රු. 5,580 පටන්ගෙන රු. 240 වාර්ෂික වේතනාධික 4කින් රු. 6,540 තෙක් වැඩි වේ.

2. **ඉල්ලුම් පත්.**—මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල වන ලෙස පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අගෝස්තු 18 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත් එවිය යුත්තේ ඉල්ලුම්කරුවන් දැනට සේවය කරමින් සිටින දෙපාර්තමේන්තු ප්‍රධානයින්ගේ මාර්ග යෙනි.

3. **සුදුසුකම්.**—ඉල්ලුම්කරුවන් රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් හෝ සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පංතියේ I ශ්‍රේණියේ වර්ෂ 4ක සේවය සම්පූර්ණ කර ඇති හෝ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් විය යුතුය. ඉල්ලුම් කරුවන් සංවිධානය කිරීමේ දක්ෂතාවය හා පරිපාලන ශක්තිය ඇති අය විය යුතු ය.

ඉඩම් ලේකම් කාර්යාලයන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයන් සම්බන්ධ දෙපාර්තමේන්තුවේ වැඩ පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවීමට යටත් ය.

(ආ) සාමාන්‍ය ලිපිකරු සේවයෙන් එක එල්ලේ බඳවාගනු ලබන නිලධාරියෙකු නම්—

(i) ප්‍රථමයෙන් ම වර්ෂයක් ගතවන තුරු පත්වීම වැඩ බැලීමේ තත්ත්වයේ එකක් වේ. එම කාලය තුළ වැඩ බැලීමේ කාලයට කරනු ලබන ගෙවීම් පිළිබඳ රෙගුලාසිවලට අනුකූලව වැඩ බැලීමේ තනතුරට අයත් වේතනය ගෙවනු ලැබේ.

(ii) රෙජිස්ට්‍රාර් සේවයේ තනතුරෙහි ස්ථිර කරනු ලැබීමෙන් පසු සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාජිකත්වය අහිමි වන අතර එම සේවයට ආපසු යෑමේ අයිතිය ද නැති වී යනු ඇත.

(ඇ) පත්කිරීමට තෝරා ගනු ලැබූ නිලධාරියෙකු මීට පෙර එම පරීක්ෂණයෙන් සමත් වී නොමැති නම් දෙපාර්තමේන්තු රෙගුලාසි හා දෙපාර්තමේන්තුවේ පරිපාලනයට අයත් නොයෙකුත් ආඥාපනත් සම්බන්ධයෙන් ඔහුගේ දැනීම පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත සමත් විය යුතු ය. මෙම පරීක්ෂණ යෙන් සමත්වීමට නොහැකි වුවහොත් වේතනාධිකය නවතනු ලැබේ. දෙවර්ෂයක් ඇතුළත සමත් වුවහොත් නවතා ගත් වේතනාධිකයන් සමඟ වේතනාධික ගෙවනු

ලැබේ. දෙවර්ෂයක් ඇතුළත සමත් නොවුවහොත් විභාගය සමත් වීමට වර්ෂයකට වැඩියෙන් ගත් කාලයෙන් ප්‍රථම වේතනාධිකය ප්‍රමාද කරනු ලැබේ.

(ඈ) තෝරා ගනු ලබන නිලධාරියා දෙපාර්තමේන්තුව ඇතුළත රෙජිස්ට්‍රාර් සේවයේ ඕනෑම තනතුරකට මාරු කරනු ලැබීමට යටත් ය.

(ඉ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවන්ට ද අනුකූලව ඔහු ක්‍රියා කළ යුතු වේ.

5. ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ වෙනයම් ලියකියවිලි එවිය යුත්තේ රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත මිස දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලික වශයෙන් නොවේ.

මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

රො. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1969 ජූලි 11 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘති පත්‍රය

#### රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තනතුර

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) අගට යෙදෙන නම :————.

(ආ) අනෙක් නම් :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————.

(4) (අ) රජය යටතේ ඉල්ලුම්කරු දැනට දරන තනතුර :————.

(ආ) රජය යටතේ සේවය කර ඇති කාලය සහ එක් එක් දෙපාර්තමේන්තුවක සේවය කර ඇති කාල පරිච්ඡේදයන් :————.

(ඇ) සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ විශේෂ ශ්‍රේණියේ ද, I ශ්‍රේණියේ ද යනු සහ එම ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :—

(i) ශ්‍රේණිය :————.

(ii) ඇතුළත් වූ දිනය :————.

(5) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇත් නම් ඒ පිළිබඳ විස්තර :————.

(6) (අ) සිංහලෙන් සමත්ව ඇති විභාග :————.

(ආ) දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්හි දැනුම :—

(1) දෙමළ :————.

(2) ඉංග්‍රීසි :————.

(7) විශේෂ හිමිකම්, සුදුසුකම් ආදිය ඇත් නම් ඒ පිළිබඳ විස්තර :————.

(8) මේ හා අදාල වන වෙනත් කරුණු සඳහන් කිරීමට ඇත් නම් :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–790—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඉංජිනේරු සහ සහකාර ඉංජිනේරු තනතුරු

නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ කම්හල් ඉංජිනේරු සහ සහකාර ඉංජිනේරු තනතුරු සඳහා වෘත්තීය සුදුසුකම් හිමි ඉංජිනේරුවරු වෙතින් අයදුම් පත් කැඳවනු ලැබේ.

විදේශීය උපදේශකයින් යටතේ කල්ක සහ කඩදාසි කාර්මික විද්‍යාව පිළිබඳව පළපුරුද්දක් තෝරාගත් අයදුම්කරුවන්ට ලබාදීම සඳහා පහසුකම් සලසනු ලැබේ. පසුව ඔවුනට පිටරටවල විශේෂඥතා පුහුණුවීමේ පහසුකම්ද බලාපොරොත්තු විය හැක.

වයස.—අවුරුදු 25 සිට 40 දක්වා.

කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ අනුමැතිය අනුව පළපුරුද්ද හා සුදුසුකම් ගැන සලකා බලා සුදුසු වැටුපක් තීරණය කරනු ලැබේ.

අයදුම් පත් කැඳවීම 1969 ජූලි මස 30 දින අවසන් වේ.

මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර මගින් පිළියෙල කරන ලද අයදුම් පත්, පහත අත්සන කර ඇති අය වෙත ඉහත සඳහන් දිනයේ දී හෝ එයට පෙර එවිය යුතුය.

කි. බ. නාරත්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

135, යුනියන් පෙදෙස,
තැ. පෙ. 1367,
කොළඹ 2,
69. 7. 8.

7–804—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි චිත්‍රකර්ම උපදේශක/උපදේශිකා තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ ගුරු විද්‍යාලයයන්හි චිත්‍රකර්ම උපදේශක/උපදේශිකා තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය) සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරගත යුතු වූ අයදුම් පත්, 1969 අගෝස්තු මස 1 වැනි දිනට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන්.—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම සඳහා කරන ඉල්ලීම් භාරගත නොහැකිය. මෙම දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව, අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කර ගත යුතුය.

(ii) යම්කිසි අයදුම්පතක් තැපෑලේ දී නැතිවී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපනයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම්පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් එසේ පමාවීමෙන් සිදු වන පාඩුව විඳ දරාගත යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුව හොත්, ඔවුන් මෙම තනතුරු දරණ තෙක්, තනතුරු විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

3. වැටුප් හා දීමනා.—රු. 1,560 — 14 × 72 — රු. 2,568 (කාර්යක්ෂමතා කඩඉම) රු. 2,640 — 5 × 120 — රු. 3,240 වාර්ෂිකව.

කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම, උසස් සුදුසුකමක් ලබාගැනීමට, නිදර්ශනයක් වශයෙන් : රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ උසස් පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිම කිරීමට යටත්ව කරනු ලැබේ. එවැනි උසස් සුදුසුකමක් ලබා නොගන්නා අය රු. 2,568 වාර්ෂික වැටුප් පියවරේ නවතිනු ඇත. (රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ උසස් සහතිකය ලබා ඇති අය කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ).

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව,

(බී) 1969.8.1 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 22 ට අඩු හෝ අවුරුදු 45 ට වැඩි හෝ නොවිය යුතුයි. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාල නොවේ.),

(සී) සිංහල/දෙමළ විෂයයක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සිංහල භාෂාව/දෙමළ භාෂාව සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්ව තිබීම හෝ ඊට උසස් විභාගයකින් සමත්ව තිබීම හා පහත සඳහන් එක් සුදුසුකමක් ලබා තිබිය යුතුයි :—

(1) අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සිංහල/දෙමළ/ඉංග්‍රීසි චිත්‍රකර්ම සහතිකය, හෝ

(2) ශ්‍රී ලංකා ජාතික කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ උසස් සහතිකය, හෝ

(3) ශ්‍රී ලංකා ජාතික කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ තුන් අවුරුදු සාමාන්‍ය සහතිකය, හෝ

(4) චිත්‍රකර්ම ගුරුවරුන්ගේ සාමාන්‍ය පාඨමාලා සහතිකය, හෝ

(5) පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක චිත්‍රකර්ම පිළිබඳ උපාධිය හෝ අවසාන සහතිකය ලබා තිබිය යුතුය.

ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ වැ.බ. ස්ථිර ලේකම්.

1969 ජූලි මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**රජයේ ගුරු විද්‍යාලයයන්හි චිත්‍රකර්ම උපදේශක/උපදේශිකා තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි**

1. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරුත් සමඟ නම :————.
(මයා., මිය., මෙනවිය යන වග සඳහන් කරන්න.)

2. ලිපිනය :—
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.

3. 1969.8.1 වැනි දිනට නිවැරදි වයස :—.
අවුරුදු…………මාස…………දින…………

4. ජාතිය හා එය ලත් අන්දම :————.

5 උපන් ස්ථානය :—.
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් (ලබා තිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත්වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන ෆෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුල්වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුරු | සේවාකාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | | | | | |

10. සිංහල/දෙමළ පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය). රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය:—
(1)————.
(2)————.
(3)————.

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්ට ලැබුණ හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————,
දිනය :————. ඉල්ලුම්කරුගේ අත්සන.

7–736—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය.

---

### ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

**කාර්මික සහායක (යාන්ත්‍රික) තනතුර**

ආයතනයේ සේවයේ කාර්මික සහායක තනතුරක් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. කාර්මික සහායකගේ ප්‍රධාන රාජකාරි වනුයේ කර්මාන්තශාලා, මෝල් හා වැඩපොළවල් පරීක්ෂාකර වාර්තා කිරීමත්, මධ්‍යස්ථ හා කුඩා කර්මාන්ත ව්‍යාපාරවල කාර්මික් අංග සම්බන්ධව අගය සෙවීමක්, යන්ත්‍රෝපකරණ වල තක්සේරු පරීක්ෂාකර වාර්තා කිරීමත්, එවැනි යන්ත්‍රෝපකරණ වල කාර්යක්ෂම භාවිතය හා සැලැස්ම ගැන උපදෙස් දීමත් හා දීර්ඝකාලීන ණය අවශ්‍යතා සම්බන්ධයෙන් මධ්‍යස්ථ හා කුඩා නිෂ්පාදන ව්‍යාපාර සාර්ථක ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය කාර්මික දක්ෂතාවය හා සුදුසුතාවය ගැන කරුණු සොයා තක්සේරු කිරීමත්ය. මේවාට අමතරව වරින්වර පැවරුම් කරන පරිදි වෙනත් රාජකාරිවල නිරත වීමටද ඔහුට සිදුවෙනවා ඇත.

2. **වැටුප, ජීවනාධාර හා සේවා කොන්දේසි :**

(අ) තනතුරට අදල මූලික වැටුප් පරිමාණය—

මසකට $\frac{\text{රු. 370 සිට රු. 670}}{\text{රු. }30 \times 10}$

(ආ) මූලික වැටුපට අමතරව ආයතනයේ ක්‍රමය අනුව තාවකාලික ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ද, රජයේ ප්‍රමාණය අනුව ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ.

(ඉ) විශේෂ සුදුසුකම් හා සැලකිය යුතු පළපුරුද්දක් ඇති අපේක්ෂකයෙකු තනතුරට තෝරා ගත්තොත්, ඔහුට පත් වීම දෙනු ලබන අවස්ථාවේදී මසකට රු. 650 ට අඩු නොවන දළ වැටුපකින් ආරම්භ වන ලෙස වැටුප් පරිමාණ යේ මූලිකයට වඩා ඉහළින් තබනු ඇත. නමුත් පත්වීම කළාට පසු එසේ තබනු නොලැබේ.

3. **කාර්ය කොන්දේසි.—**

(අ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හා 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සම්පාදනය කළ හා සම්පාදනය කරනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කිරීමට පත්වීම ලබන්නාට සිදුවේ.

(ආ) පත්වීමේ ආධුනික කාලය පළමුව එක් වසරකි. පත්වීම ලබන්නාට රාජ්‍ය භාෂා පනතේ ව්‍යවස්ථාවලට අනුකූලව සිංහල ප්‍රවීණත්වය ලැබීමට හැකිවන පරිදි ආධුනික කාලය වසර තුනකට දීර්ඝ කරණු ලැබේ. පත්වීම ලබන්නාට නියමිත ශ්‍රේණිය අනුව ප්‍රවීණත්වය ලබාගැනීමට නොහැකි වුව හොත් ඔහුගේ තනතුර නිමාවට පත්කරනු ලැබේ.

(ඉ) තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ආයතනයේ අර්ථසාධක අරමුදලට සම්පූර්ණ ඉපැයුමෙන් ප්‍රතිශත 10 ක් පත්වීම ලබන්නාට දායකවීමට සිදුවන අතර, මනාප පරිදි තවත් ප්‍රතිශත 10 ක් ඊට දායකවීමට ඔහුට අවකාශ දෙනු ලැබේ. ආයතනය ඊට ප්‍රතිශත 15 ක් දායක වනු ලැබේ. කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතන අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සම්මතය ලැබූ එකකි.

(ඊ) ආධුනික කාලය තුළදී කිසිදු දැන්වීමක් නොකර තනතුර ඕනෑම අවස්ථාවක නිමාකළ හැකිය.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම—

(අ) පුරවැසි පනත අනුව ලාංකික පුරවැසියෙකු විය යුතුයි ;

(ආ) මනා චරියතකින් හා ශාරීරික සුදුසුකමින් යුක්තවිය යුතුයි ;

(ඉ) 1969 අගෝස්තු 15 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුයි ;

(ඊ) කොළඹ, ලංකා කාර්මික විද්‍යාලය හෝ කටුබැද්දේ ප්‍රායෝගික අභ්‍යාස ආයතනය හෝ අම්පාරේ, හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික අභ්‍යාස ආයතනය ප්‍රදානය කළ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ සහතිකය ලබා තිබිය යුතුය.

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගර සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගර සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘතිපත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1969.8.21 වන දිනට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

**2.** මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එහෙත් එක් එක් හදිසි මරණ පරීක්ෂණ වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

**3. සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු විසින්ම පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහත කී නගර සහ ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම. යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන්වත් සමත්වී සිටීම.

**4.** අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) ඉල්ලුම්කරුගේ චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික 2 ක්.

**5.** රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

**6.** කුරුණෑගල වැඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගර සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා 1969.3.30 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය අවලංගු කළාසේ සැලකිය යුතුයි.

**7.** ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුවේ.

ශී. බ. දිසානායක,
කුරුණෑගල දිසාපති.

1969. 7. 9 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල නගරයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
   (පෙලපත් නාමය සමග පැහැදිලි අකුරින්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් එය පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපළවලට වටිනාකම සහ ප්‍රමාණය, විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–734—69.7.18 දන අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

**තැපැල් ස්ථානාධිපති සහ සංඥදයකයින් බඳවා ගැනීමේ විභාගය—1969**

**විභාගය පවත්වන දිනය : 1969 ඔක්තෝබර් 31 වැනි සිකුරාද**

**2.** තැපැල් ස්ථානාධිපති සහ සංඥදයකයින් වශයෙන් පිරිමි අයදුම කරුවන් බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් 1969 ඔක්තෝබර් 31 වැනි දින පහත සඳහන් මධ්‍යස්ථාන වල පවත්වනු ලැබේ.

කොළඹ, ගම්පහ, කළුතර, මොරටුව, මීගමුව, ගාල්ල, හම්බන්තොට, මාතර, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, කෑගල්ල, රත්නපුරය, මහනුවර, මාතලේ, නුවරඑළිය, යාපනය, වඩ්ඩුකොඩෙ මන්නාරම, පේදුරුතුඩුව, වවුනියාව, බදුල්ල, හලාවත, කුරුණෑගල, මොණරාගල සහ අම්පාරේ.

අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථාන කිසිවක් වෙතොත් ඒවා අවලංගු කිරීමට ඉඩ ඇත.

**3. විභාගය පවත්වනු ලබන මාධ්‍යය.**—(අ) මෙම විභාගය, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන් තුනෙන් ම පවත්වනු ලැබේ.

(ආ) සිංහල මාධ්‍යයෙන් සුදුසුවීමේ විභාගය සමත් වූ අයදුම්කරුවෝ ඒ මාධ්‍යයෙන් ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ. දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් සුදුසුවීමේ විභාගය සමත් වූවෝ මෙම විභාගය සඳහා සිංහල මාධ්‍යය තෝරා ගනිතොත් මිස තමන් සාමාර්ථය ලත් මාධ්‍යයෙන් ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ. මෙහි පහත දක්වෙන 4 (1) වැනි ඡේදයෙහි "ඇ" අක්ෂරය යටතේ දක්වෙන සුදුසුකම් ඇත්තෝ කණිෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන්, තමන් සාමාර්ථය ලැබූ මාධ්‍යයෙන් ම මෙම විභාගයට පෙනී සිටිය යුත්තාහ. එහෙත් දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් සාමාර්ථය ලත් අයට මෙම විභාගය සඳහා සිංහල මාධ්‍යය තෝරා ගත හැක.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් ගැන තැකීමක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට අවසර ඇත්තාවූ සහ 4 (1) වැනි ඡේදයෙහි දක්වෙන සුදුසුකම් ලැබීමේ කිසිම විභාගයකින් සාමාර්ථය නොලැබූ තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ දනටමත් සේවයෙහි යෙදී සිටින නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ මාධ්‍යයෙන් ම මෙම විභාගයට පෙනී සිටිය යුතුය. එහෙත් දෙමළ හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූවන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සිංහල මාධ්‍යය තෝරා ගත හැක.

**4. සුදුසුකම්—සාමාන්‍ය කොන්දේසි**—(1) අයදුම්කරුවෝ යටත් පිරිසෙයින්—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන්, හෝ

(ආ) සිංහල හෝ දෙමළ හෝ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය සහ වෙනත් විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය ලැබ සිටිය යුත්තාහ. මෙකී විෂයයන්ගෙන් අඩු වශයෙන් විෂයයන් පහකින් වත් එක් වර සාමාර්ථය ලැබ සිටිය යුතු ය.

එසේ නැතහොත්,

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන වාණිජ සහතිකපත්‍ර විභාගයෙන් හෝ,

(ඈ) පහත සඳහන් විභාග අතුරෙන් එක් විභාගයකින් සාමාර්ථ්‍ය ලැබ සිටිය යුත්තාහ—

(i) කේම්බ්‍රිජ් ජූනියර් සහතික පත්‍රය, හෝ

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි),

(iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගත් පාඨශාලාවක කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)

යන මේවායින් එකක් සමඟ පහත සඳහන් විභාගයකින් ද සාමාර්ථය ලැබ සිටිය යුත්තාහ :—

(1) ලංඩන් වාණිජ මණ්ඩලයේ ලංකා පරිපාටිය යටතේ වාණිජ අධ්‍යාපනික සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝුලේඛක ටයිප්කාර අංශය) (විදේශ) හෝ උසස් වාණිජ අධ්‍යාපනික සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝුලේඛක ටයිප්කාර අංශය) (විදේශ),

(2) ලංකා වාණිජ මණ්ඩලය සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිරිනමනු ලබන වාණිජ අධ්‍යාපන සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝු ලේඛක ටයිප්කාර අංශය) හෝ උසස් වාණිජ අධ්‍යාපන සහතික පත්‍රය (පොදු වාණිජ හෝ ලඝුලේඛක ටයිප්කාර අංශය),

(3) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ සහතික පත්‍රය හෝ උසස් වාණිජ සහතික පත්‍රය (පොත් තබන්නන් හෝ ලඝු ලේඛක ටයිප්කරුවන් සඳහා),

(2) අයදුම්කරුවෝ—

(අ) උසින් අඩි පහකට අඩු නොවිය යුත්තාහ.

(ආ) ඇස් පෙනීම සහ කන් ඇසීම හොඳ තත්ත්වයෙන් යුක්ත අය විය යුත්තාහ.

(ඇ) විදුලි පණිවුඩ සහ ටැලිෆෝන පිළිබඳ කටයුතු කාර්යක්ෂමව කිරීමට බාධාවක් වන සේ කථා කරන විට ගොත ගැසීමක් හෝ කථා බස් කිරීමේ දී වෙන කිසියම් දෝෂයක් හෝ නොමැති අය විය යුත්තාහ.

(ඈ) පැහැදිලිව ලිවීමට හා සිංහලෙන්, දෙමළෙන් විනාඩියකට වචන 15 බැගින් හෝ ඉංග්‍රීසියෙන් විනාඩියකට වචන 22 බැගින් හෝ කියවන විට ලිවීමට සමත් අයවිය යුත්තාහ. අයදුම්කරුවෝ **වම් අත පුරුදුවූවන් නොවිය යුත්තාහ.**

(3) (අ) අයදුම්කරුවෝ 1969 අගෝස්තු 31 වැනි දිනට වයස අවුරුදු 17ට නොඅඩු 26 ට නොවැඩි විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවෝ යහපත් චරිතයකින් යුක්ත විය යුත්තාහ.

(ඇ) අයදුම්කරුවෝ ලාංකිකයින් විය යුත්තාහ. මේ පත්වීම් පිළිබඳ කරුණු උදෙසා " ලාංකික " යන්නෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචිවීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලත් අය වේ.

**සැලකිය යුතුයි.**—(i) ඉහත (2) (අ) සහ (ඈ) ඡේදයෙහි නියම කර ඇති පරිදි අයදුම්කරුවන් උසින් අඩි පහකට අඩු නොවිය යුතු බවට සහ ඔවුන් වම් අත පුරුදු වූවන් නොවිය යුතු බවට කර ඇති නියමයන් තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි නියුක්ත නිලධාරීන් ට අදාළ නොවේ.

(ii) මෙම විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ප්‍රතිඵල නිකුත් කරනු නො ලැබූ ඉහත සඳහන් කිසියම් විභාගයකට පෙනී සිටි අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

**5. තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයේ යෙදී සිටින නිලධාරීන්ට ලැබෙන විශේෂ අනුග්‍රහයන්—**

**(අ) ස්ථිර සේවකයින් :**

(i) 1969 අගෝස්තු 31 වැනි දිනට තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අවුරුදු 4කට වැඩි ස්ථිර සහ සතුටුදායක සේවයක් කර ඇති සියළුම සේවකයින්ට (වෙන දෙපාර්තමේන්තුවක ස්ථිර හෝ තාවකාලික ධුරයක හෝ මෙම දෙපාර්තමේන්තුවේ තාවකාලික ධුරයක හෝ සේවයෙහි යෙදී සිටීම අවුරුදු 4ක සේවා කාල පරිච්ඡේදය සඳහා ගණන් ගනු නොලැබේ.) වයස හා අධ්‍යාපන සුදුසුකම් ගැන තැකීමක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) දැනට අඩුම අධ්‍යාපන සුදුසුකම් වශයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට වඩා අඩු අධ්‍යාපන සුදුසුකම් නියම කර තිබෙන ශ්‍රේණියකට මුලින් බඳවා ගනු ලැබුවාවූත්, පොදු තරඟ පරීක්ෂණයේදී ස්ථානයක් ලබා ගැනීමට නොහැකි වූවාවූත්, 1969 අගෝස්තු 31 වැනි දිනට දෙපාර්තමේන්තුවේ අවුරුදු 4කට වැඩි ස්ථිර සහ සතුටුදායක සේවයක් කර ඇති එවැනි සියලුම සේවකයින්, මෙම විභාගය සඳහා වන මුළු ලකුණු ගණනින් අඩු වශයෙන් සියයට 40ක් වත් ලබා ගෙන ඇත්නම් ඔවුනට තැපැල් ස්ථානාධිපති සහ සංඥායක සේවයේ පුරප්පාඩුවලින් සියයට 50ක් සඳහා ඔවුනොවුන් අතර තරඟ කිරීමට ඉඩ දෙනු ලැබේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව විශේෂයෙන් වෙන් කළ සියයට 50ට අඩු වුවහොත් ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන්නේ විභාගය සඳහා වන මුළු ලකුණු ගණනින් අඩු වශයෙන් සියයට 50ක් වත් ලබාගන්නාවූත්, පොදු තරඟ පරීක්ෂණයේදී සාමාර්ථය ලබන්නාවූත් අය අතුරෙනි.

(iii) 1969 අගෝස්තු 31 වැනි දිනට තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අවුරුදු දෙකකට වැඩි, ස්ථිර සහ සතුටුදායක සේවයක් කර ඇති සියළුම සේවකයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) සාමාර්ථය ලබා ඇත්නම් ඔවුනට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(iv) තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයින් 4 (1) වැනි ඡේදයෙහි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්නම්, සේවා කාලය ගැන, තැකීමක් නොමැතිව ඔවුනට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**(ආ) තාවකාලි සේවකයින් :**

(i) 1969 අගෝස්තු 31 වැනි දිනට තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අවුරුදු 4ක සතුටුදායක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සියළුම තාවකාලික සේවකයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) සාමාර්ථය ලබා ඇත්නම් ඔවුනට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) 1969 අගෝස්තු 31 වැනි දිනට තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ අවුරුද්දක් සතුටුදායක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සියළුම තාවකාලික සේවකයින් 4 (1) වැනි ඡේදයෙහි නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්නම් සහ 1969 අගෝස්තු 31 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු නම් ඔවුනට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**(ඇ) උප තැපැල් ස්ථානාධිපතීන් :**

(i) 1969 අගෝස්තු 31 වැනි දිනට දෙපාර්තමේන්තුවේ අවුරුදු 4ක සතුටුදායක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති උප තැපැල් ස්ථානාධිපතීන්ට වයස සහ අධ්‍යාපන සුදුසුකම් ගැන තැකීමක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) 1969 අගෝස්තු 31 වැනි දිනට දෙපාර්තමේන්තුවේ අවුරුද්දක සතුටුදායක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති උප තැපැල් ස්ථානාධිපතීන් 4 (1) ඡේදයෙහි නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්නම් ඔවුනට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**(ඈ) අනියම් සේවකයෝ :**

දෙපාර්තමේන්තුවේ දෛනික වැටුප් පිට අනියම් පදනමක් මත සේවය කරන හෝ පූර්ණ කාල අනියම් පදනමක් මත කඩින් කඩ සේවය කරන 1969 අගෝස්තු 31 වැනි දිනට මුළුමනින් ම අවුරුද්දක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සියළුම අනියම් සේවකයන් 4 (1) වැනි ඡේදයේ නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා ගෙන තිබේ නම් ද 1969 අගෝස්තු 31 වැනි දිනට වයස අවුරුදු 45 කට නොවැඩි නම් ද, ඔවුන්ට මේ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. (1) බඳවා ගැනීම පිළිබඳ පාලනය පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ පිට පවතින ශ්‍රේණියකට හෝ සේවයකට හෝ අයත් තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සේවකයෝ පමණක් ඉහත සඳහන් 5 වැනි ඡේදයෙහි දැක්වෙන අනුග්‍රහයන් වලට හිමිකම් ලබන්නෝ වෙත්.

**(2) මෙම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ට, උප තැපැල් ස්ථානාධිපතීන්ගේ සහකරුවන්ට සහ උපතැපැල් ස්ථානාධිපතීන්ගේ ආදේශකයන්ට, ඉහත සඳහන් 5 වැනි ඡේදයෙහි දැක්වෙන අනුග්‍රහයන් හිමි නොවේ.**

7. **සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි.**—තැපැල් ස්ථානාධිපති සහ සංඥායකයින්ගේ සේවය ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත සේවයකි. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

8. **වැටුප් සහ සේවා කොන්දේසි.**—(i) (අ) පුහුණුව ලබන කාලය තුළ ජීවනාධාර දීමනා සමඟ මසකට රුපියල් 60 බැගිනි.

(ආ) II වැනි පෙළ තැපැල් ස්ථානාධිපති සහ සංඥායක වශයෙන් පත් කිරීමෙන් පසු වර්ෂයකට රුපියල් 960, (1 වැනි වර්ෂය) වර්ෂයකට රු. 1,080 (2 වැනි වර්ෂය) ඉන්පසු රුපියල් 1,740 හා රුපියල් 2,940 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රුපියල් 1,260 — 120 —රු.3,780 බැගිනි.

(ii) සාමාර්ථය ලත් අයදුම්කරුවන්ට නිවාඩු කාලය අත්හැර හය මාසයක් පමණ කාලයක් තැපැල් සහ විදුලි පණිවුඩ අභ්‍යාස පාසැලෙහි සහ තැපැල් කාර්යාලයක ද පුහුණුවීමට නියම කරනු ලැබේ.

(**සැලකිය යුතුයි.**—එසේ වුවද මුලදීම කෙටි පුහුණුවක් දීමට දෙපාර්තමේන්තුවට විධිවිධාන යෙදිය හැක. මෙවැනි අවස්ථාවන්හි දී දෙපාර්තමේන්තුවට පහසු අන්දමට රාජකාරියට පත් කිරීමෙන් පසු සවිස්තර පුහුණුවක් දීමට විධිවිධාන යොදනු ඇත).

පුහුණුවීමේ කාලය තුළ අයදුම්කරුවන්ට විදුලි පණිවුඩ කාරකයන්, ටෙලි-ටයිපිස්ට් සහ ටෙලිෆෝන් ඔපරේටර්වරුන් වශයෙන් ද, මුදල් ගනුදෙනු කටයුතු සම්බන්ධ කවුන්ටර් රාජකාරි පිළිබඳව ද පුහුණුවක් දෙනු ලැබේ. මෙම පුහුණුවට සිංහල සහ දෙමළ විදුලි පණිවුඩ අක්ෂර පරිවර්තනය ඇතුළුව, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ටැලිෆෝන විදුලි පණිවුඩ සහ විදුලි පණිවුඩ භාර ගැනීම සහ බෙදීම පිළිබඳ කාර්ය පරිපාටිය ද ඇතුළත් වේ. මේ සඳහා යම්කිසි ගාස්තුවක් ගෙවීමට හෝ මුදලක් තැන්පත් කිරීමට හෝ ඔවුන්ට නියම කරනු නො ලැබේ. පුහුණුව ලබන කාලය තුළ ගෙවනු ලබන දීමනා මුදල නිවාඩු කාල සඳහා හෝ අන් කවර කාරණයක් නිසා හෝ නොපැමිණ සිටි කාලය සඳහා සමානුපාතිකව අඩු කරනු ලැබේ. එහෙත් මේ දීමනාව ගෙවීම රඳාපවත්නේ ඔවුන්ගේ සතුටුදායක හැසිරීම සහ ඔවුන් ලබන දියුණුව උඩය. ඉගෙනීම පිළිබඳ ලබන දියුණුව සම්බන්ධයෙන් හා යහපත් හැසිරීම සම්බන්ධයෙන් යම්කිසි අයදුම්කරුවකු පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂතුමා සතුටට පත් වන සේ කටයුතු නො කළහොත් පුහුණුව ලබන කාලය තුළ ඔහු ඕනෑම අවස්ථාවක වහාම අස්කිරීමට හා ඔහුගේ දීමනා මුදල අහිමි කිරීමට ද ඉඩ තිබේ. එසේ අස් කරන ලද අයදුම්කරුවෙකු වේ නම් ඔහු මතුවටත් තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා නුසුස්සකු වනු ඇත.

(iii) ඉගෙනීමේ කාල සීමාව අවසානයේදී අයදුම්කරුවන් පුහුණුව ලැබූ විෂයයන් පිළිබඳ පරීක්ෂණයකට ඔවුන් භාජනය කරනු ලැබේ. එයින් සාමාර්ථය ලබන අය පුරප්පාඩු ඇති වන පරිද්දෙන් අවුරුදු තුනක ආධුනික කාලයක් පිට, තැපැල් ස්ථානාධිපති සහ සංඥායක සේවයට පත් කරනු ලැබේ. මෙහි පහත දැක්වෙන (IV) කොන්දේසියේ නිර්දේශයන්ට යටත්ව, මෙම පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප වන අයදුම්කරුවන් තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ සේවයට නුසුදුස්සන් වනු ඇත.

(iv) යම්කිසි අයදුම්කරුවෙකුට විදුලි සන්දේශ පාලකගේ නිර්දේශ පිට, විශේෂ අවස්ථාවන්හිදී සුදුසුයයි හැඟෙන තවත් වැඩිපුර කාලයක් තම වියදමින් මෙම අභ්‍යාස පාසැලේ සිටීමට පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ වරයාට අවසර දිය හැක. එම කාල පරිච්ඡේදය අවසාන යේදී එබඳු අයදුම්කරුවෙකු වේ නම් ඔහු සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ යක් කරනු ලැබේ.

(v) තැපැල් සහ විදුලි පණිවුඩ අභ්‍යාස පාසැලේ මුළු පාඨමාලාව සම්පූර්ණ කිරීමට පෙර සිය කැමැත්තෙන් ම ඉල්ලා අස්වන තැපැල් සහ විදුලි පණිවුඩ ආධුනිකයෙකුට එම පාසැලේ පුහුණුව ලැබූ කාලය තුළ ලබාගත් සියළුම දීමනා ආපසු ගෙවන ලෙස නියම කරනු ලැබේ.

(vi) සමසක සම්පූර්ණ පුහුණුව ලබා දීමට පෙර තැපැල් ස්ථානාධිපති සහ සංඥදයක ශ්‍රෙණියට පත් කරනු ලබන අයදුම්කරුවෝ, තැපැල් සහ විදුලි පණිවුඩ අභ්‍යාස පාසැලට පුහුණුව සඳහා කැඳවන විට, පුහුණුව අවසාන යෙන් පසු පළමුවෙන් තුන් අවුරුද්ද තුළ තැපැල් ස්ථානාධිපති සහ සංඥදයක සේවය අත්හැර යන්නේ නම්, තමන් පුහුණුව ලැබූ කාලය තුළ ලබා ගන්නා ලද සියළුම මුදල් ආපසු ගෙවන බවට පොරොන්දු පත්‍රයකට ඇතුළත් විය යුත්තාහ.

(vii) පෝය දින හා නිවාඩු දින ඇතුළු සෑම දිනකම රාජකාරිය කිරීමට තැපැල් ස්ථානාධිපති සහ සංඥදයකවරු බැඳී සිටිති. පෝය දිනවල සහ තැපැල් කාර්යාල නිවාඩු දිනවල කරන රාජකාරි සඳහා අතිරේක මුදල් ලැබීමට ඔවුන්ට හිමිකම් තිබේ. දිවා කාලයෙහි හෝ රාත්‍රි කාලයෙහි හෝ ඕනෑම වේලාවක ආරම්භ වන හෝ කෙළවර වන හෝ රාජකාරී වාරයන්ට ඔව්හු පැමිණිය යුත්තාහ. ඔවුන් එක් එක් ස්ථානවලට මාරු කිරීමට ඉඩ ඇති අතර ලංකාවේ ඕනෑම ස්ථානයක නතර කර තැබීමට පිළිවන.

(viii) රජයේ නිලධාරීන්ගේ ඇප ආඥපණත අනුව තැපැල් ස්ථානාධිපති සහ සංඥදයකයින් විසින් ඇපයක් තැබිය යුතුය.

(ix) තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ තැපැල් ස්ථානාධි පති සහ සංඥදයකයින් වශයෙන් පත් කිරීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගිවිසුම් පත්‍රයේ නියම කර ඇති පරිදි හැර, වෙන කිසියම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට ඇතුළත්වීමේ විභාගයකට පෙනී සිටීමට හෝ වෙන කිසියම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක තනතුරක් ඉල්ලීමට හෝ භාර ගැනීමට හෝ අවසර දෙනු නො ලැබේ.

(x) මෙම පත්වීම, කාර්ය සංවිධාන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග යන මේවාට සහ ආණ්ඩුව මගින් කලින් කල නිකුත් කරනු ලබන අනිකුත් ව්‍යවස්ථා සහ රෙගුලාසී වලට ද යටත් වේ.

(xi) ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා තම ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වන ලෙස සාමාර්ථ්‍යය ලැබූ අයදුම් කරුවන්ට නියම කරනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී යම් අයදුම් කරුවකු ශාරීරිකව අයෝග්‍යයයි පෙනී ගියහොත් ඔහුගේ තාවකාලික පත්වීම අවලංගු කරනු ලැබේ.

(xii) අයදුම්කරුවෝ, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙදවීම පිණිස ද දැනටමත් පනවා ඇති හෝ මින් මතු පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කළ යුත්තාහ.

(xiii) සම්පූර්ණයෙන්ම සිංහල මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී නොසිට පත් කිරීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් තම ආධුනික කාලය තුළදී සිංහලය පිළිබඳව ප්‍රවීණත්වයක් ලබාගත යුතුය. එක් එක් පරීක්ෂණය ඉදිරියෙන් දක්වා ඇති කාල සීමාවන් තුළදී ඔවුන් පහත සඳහන් සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් විය යුතුයි :—

**පරීක්ෂණයේ තත්ත්වය**

(i) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය

(ii) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය

(iii) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය

**පරීක්ෂණය සමත්වීම සඳහා දී ඇති කාලසීමාව :**

(i) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය —පත්වීමේ දින සිට අවුරුදු 1යි

(ii) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය—පත්වීමේ දින සිට අවුරුදු 2යි

(iii) වැනි ශ්‍රෙණියේ ප්‍රවීණතා පරීක්ෂණය—පත්වීමේ දින සිට අවුරුදු 3යි

ආධුනික කාල සීමාව අවසන් වීමෙන් පසු මෙම අයදුම්කරුවන් ස්ථිර කිරීම රඳා පවත්නේ ඔවුන්ගේ සතුටුදයක වැඩ, පැවැත්ම සහ නියමිත ප්‍රවීණතා පරීක්ෂණවලින් නියමිත කාල සීමාවන් තුළ සමත් වීම උඩය. නියමිත කාලසීමාවන් තුළදී සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට නොහැකි වුවහොත් පඩි වැඩිවීම තාවකාලිකව අත්හිටවනු ඇත. නියමිත කාල සීමාව ඉක්මවා තවත් මාස 6ක කාල සීමාවක් තුළදී මෙම පරීක්ෂණ යකින් සමත්වීමට නොහැකිවුවහොත් තාවකාලික වශයෙන් අත්හිටවන ලද පඩි වැඩිවීම සම්පූර්ණයෙන්ම නතර කරනු ලැබේ. මෙම නතර කිරීම පරීක්ෂණය සමත්වනතුරු ක්‍රියාත්මකව පවතිනු ඇත. ආධුනික කාල සීමාව අවසානයේදී නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වයට එළඹීමට නොහැකි වුවහොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල නියමයන් බලපානු ඇත.

(xiv) සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිට පත් කිරීම සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරුවන්, තමන් වෙනුවෙන් පිළියෙළ කරනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අභ්‍යාස පාඨමාලාවන් හැදෑරිය යුතුය.

9. **ඉල්ලුම් පත්‍ර**—(i) මෙම විභාගයට ඇතුළත් වීමේ ඉල්ලුම් පත්‍ර 1969 අගෝස්තු 25 වැනි දින දක්වා කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 6 වැනි මහලෙහි, පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම වල ලියා පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ නමට එවිය යුතුය.

**සැලකිය යුතුයි.**—මුද්රිත පෝරමය මොනම අන්දමකින් වත් සංශෝධනය කිරීම අයදුම්කරුවන්ට තහනම් ය. නියමිත පෝරමයේ ලියා නැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ඇත.

(ii) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර පෝර්ම 1969 අගෝස්තු 31 වැනි දිනට හෝ ඊට පෙරාතුව කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ කාර්යාලයේ පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර කිසිවක් වෙතොත් ඒවා ප්‍රතික්ෂෙප කරනු ලැබේ. විභාගයේ නම, එනම්, ''තැපැල් ස්ථානාධිපති සහ සංඥදයක යින්ගේ විභාගය '' යන්න ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරෙහි පැහැදිලිව ලිවිය යුතුය.

(iii) යථා පරිදි අවලංගු කරන ලද රු. 25 ක් වටිනා මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තිබිය යුතුය.

**සැලකිය යුතුයි.**—දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්—එනම්, බඳවා ගැනීම පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ පිට පවතින ශ්‍රෙණිවලට හෝ සේවාවන්ට හෝ අයත් සේවකයින් මුද්දර ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.

(iv) දැනටමත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සේවයෙහි නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර, තම තමන් සේවය කරන දෙපාර්තමේන්තු වල ප්‍රධානයන් මගින්, එවිය යුතුය. එසේ නොකරන යම්කිසි අයදුම් කරුවකු වෙතොත් ඔහු විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

(10) **විභාගයට ඇතුළත්වීම**—(i) ඉල්ලුම් පත්‍ර එවා භාර ගනු ලැබූ සෑම අයදුම්කරුවෙකුටම පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම් කරුවන් විසින් තම තමන්ගේ ප්‍රවේශ පත්‍ර පෝරම විභාග පරිපාලනය කිරීමට පත් කර සිටින නිලධාරියා වෙත ඉදිරිපත් කළයුතුය. එබඳු ප්‍රවේශ පත්‍ර පෝරමයක් ඉදිරිපත් නොකරන අයදුම් කරුවන්ට විභාගයට ඇතුළත් වීමට ඉඩ දෙනු නො ලැබේ.

(ii) අයදුම්කරුවන් තම තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමන්ට නියම කර තිබෙන විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවකට පැමිණෙන අයදුම්කරුවෙකුට විභාගයට ඇතුළත්වීමට අවසර දෙනු නො ලැබේ.

(iii) ප්‍රවේශ පත්‍ර පෝරමය සමඟ කාල සටහනේ පිටපතක් ද ඔවුන් වෙත ලැබෙන්නට සලස්වනු ඇත. අයදුම්කරුවන් සඳහා වූ නීති සහ උපදෙස් මේ නිවේදනයේ අග මුද්‍රණය කර ඇත. අයදුම්කරුවෝ මෙම නීති පිළි පැදීමට බැඳී සිටිති. මෙම නීති උල්ලංඝනය කිරීම පිළිබඳව පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ ගන්නා තීරණය අවසාන තීරණය වේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම තම ප්‍රවේශ පත්‍ර පෝරමය විභාග දිනයෙහි ම විභාග ශාලා පරිපාලකට භාර දිය යුතුය.

(iv) යම්කිසි අයදුම්කරුවකුට විභාගය පවත්වන දිනට යටත් පිරිසෙයින් සත් දිනකටවත් කලින් තම ප්‍රවේශ පත්‍ර පෝර්මය නොලැබුනහොත් ඔහු විසින් තමාට ප්‍රවේශ පත්‍ර පෝරමය නො ලැබුන බව පහත දැක්වෙන විස්තර සමඟ පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂවෙත නොපමාව දන්වා එවිය යුතුය.

(අ) විභාගයේ නම :————

(ආ) සම්පූර්ණ නම :————

(ඇ) විභාගය සඳහා තෝරාගත් මධ්‍යස්ථානය :————

(ඈ) සම්පූර්ණ තැපැල් ලිපිනය :————

(ඉ) තැපැල් කාර්යාලය, රෙජිස්තර අංකය සහ දිනය :————

11. **අසත්‍ය තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම.**—(i) කිසියම් අයදුම් කරුවකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් තමන් දන්නා තරමින් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ කිසියම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර තිබුණොත් හෝ විභාගයට පෙනී සිටීමට ඔහුට සුදුසුකමක් නොතිබුණ බැව් ඔහු සේවය කරන කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත් හෝ වහාම ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

(ii) මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකු ඊට පෙනී සිටීමට නුසුදුසුයයි පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවතිද්දී හෝ එයින් පසුව හෝ කවර අවස්ථාවකදී වුවද ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

(iii) අයදුම්කරුවකු විභාගයට ඇතුළත් කර ගැනීම ඔහුගේ යෝග්‍යතාව පිළිගැනීමක් වශයෙන් සලකනු නොලැබේ.

**සැලකිය යුතුයි.**—එසේ වුවද පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂකට තම අභිමතය පරිදි කිසියම් අයදුම්කරුවකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීමට ඉඩ දිය හැක. එබඳු අපේක්ෂකත්වයක් අනතුරුව ස්ථිර කරනු හෝ අවලංගු කරනු හෝ ඇත.

12. **හැඳුනුම් පත්‍ර.**—(i) අයදුම්කරුවන් විභාග ශාලාවේ දී පෙනී සිටින එක් එක් විෂයයක් පාසාම තම අනන්‍යතාවය විභාග පරිපාලන තැනට ඒත්තු යන පරිදි ඔප්පු කළ යුතුය. ඒ සඳහා මෙහි පහත සඳහන් ලියකියවිලිවලින් ඕනෑම එකක් භාරගනු ලැබේ.

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද හැඳුනුම් පතක් ;

(ආ) මෙම විභාගය පවත්වන දිනට කලින් අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් තුලදී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බලපත්‍රයක් ;

(ඇ) මෙම විභාගය පවත්වන දිනට කලින්, අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් තුළදී ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අවසරය පිට, අයිතිකරුගේ ඡායාරූපයක් සහිතව නිකුත් කරන ලද ඕනෑම සහතික පත්‍රයක්, බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ii) තම ප්‍රවේශපත්‍රයට අතිරේකව ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක්වත් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ.

13. **යෝග්‍යතාව පිළිබඳ ලියකියවිලි.**—(i) අයදුම් පත්‍රය සමඟ වෙන මොනම ලිපි ලේඛනාදියක් නොඑවිය යුතුයි. එහෙත් නියම කර ඇති පරිදි අවශ්‍ය විස්තර සියල්ල පෝරමයෙහි සඳහන් ව තිබිය යුතුය. මේ සියළුම කරුණු සම්බන්ධයෙන් අසම්පූර්ණකම් ඇති අයදුම්පත්‍රයක් වෙතොත්, එයට අදළ කරුණු සමඟ සලකා බලා ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් විසින් සිය යෝග්‍යතාව ඔප්පු කිරීම සඳහා ලියකියවිලි වලින් සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. එබඳු අයදුම්කරුවන් විසින් මෙම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම හෝ පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි විට රෙජිස්තර තැපැලෙන් නොපමාව එවීම හෝ කළ යුතුය.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍යය.—

(අ) වගකිවයුතු පුද්ගලයෙකුගේ අත්සන සහිත යහපත් චරිත පිළිබඳ සහතිකයක් ;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය (මුල් පිටපත) හෝ සහතික පත්‍රය නිකුත් කර නොමැති අවස්ථාවේ දී ඒ පිළිබඳ නිල ලියකියවිලි (එනම් ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) බාහිර අයදුම්කරුවන් වෙත නිකුත් කරන ලද ප්‍රතිඵල සටහන හෝ අයදුම්කරු අධ්‍යාපනය ලැබූ පාසැලේ ප්‍රධානයාගෙන් ලබා ගත් ලියමනක්) ;

(ඇ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය හෝ පරම්පරාවෙන් පුරවැසිභාවය ලබා ගැනීමට කළ ඉල්ලීම පිළි ගැනීමේ රාජකාරී ලියමනෙහි මුල් පිටපත (අදළ අවස්ථාවන්හිදී) ;

(ඈ) අයදුම්කරුගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික පිටපතක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් (උප්පැන්න ලියා පදිංචි නොකළ අයදුම්කරුවන් සම්බන්ධයෙනි) අනුමාන වයස පිළිබඳ සහතිකයක් පමණක් සැපයිය හැකි කිසියම් අයදුම්කරුවකුගේ උපන් දිනය සලකනු ලබන්නේ සහතික පත්‍රයෙහි සඳහන් උපන් වර්ෂයේ ජූලි මස 1 වෙනි දින වශයෙනි.

**සැලකිය යුතුයි.**—(i) පාඨශාලා හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍රය හෝ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනින් උපුටා ගත් සහතික කළ පිටපතක් හෝ භාර ගනු නො ලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බව්තීස්ම සහතික පත්‍ර භාර ගනු නො ලැබේ.

(iii) උප්පැන්න සහතික පත්‍රයෙහි දක්වෙන නම/නම් හා අයදුම්කරු සාමාන්‍යයෙන් භාවිතා කරන්නාවූත් විභාගයට ඉදිරිපත් කරන්නාවූත් නම/නම් අතර වෙනසක් තිබෙ නම් කාරණයට අදළ වන පරිදි 1951 අංක 17 දරණ උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ ආඥපනතේ 27 හෝ 28 දරණ ව්‍යවස්ථාවේ නියමන් අනුව උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනෙහි දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය. 1953 අංක 15 දරණ උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ (සංශෝධිත) ආඥ පනතේ 2 වැනි වගන්තිය මගින් සංශෝධනය කර ඇති පරිදි 1951 අංක 17 දරණ උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ ආඥපනතේ 24 (6) වගන්තිය යටතේ උපන් දින සිට අවුරුද්දකට වැඩි කාලයක් ගතවීමෙන් පසු කරවන උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහන සහතික කරන ලද පිටපතක්, පත්වීම් දිම පිළිබඳ කරුණු උදෙසා පිළිගනු ලබන්නේ උපන් දිනය තහවුරු කළ සාක්ෂි සලකා බැලීමෙන් පසුව පමණකි.

1957 අගෝස්තු 18 දින හා අංක. 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සලකා ඇති ඉඩකඩ අනුව, නම් වෙනස් කර ඇති ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ අයදුම්කරුවන් උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි තම නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කළ යුතු නොවේ.

(iv) අයදුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී මෙකී සියළුම ලියකියවිලි සූදනම් කර තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකු විසින් අවශ්‍ය ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් නොකළහොත් හෝ පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි විට ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කළහොත් හෝ ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

14. **ආපසු ගෙවීම්.**—(i) කිසිම කරුණක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ.

(ii) මෙම විභාගයට ගෙවන ගාස්තු වෙන කිසියම් විභාගයකට යෙදවිය නොහැකිය.

15. **විභාග පරිපාටිය.**—මෙම විභාගයට අයත් විෂයයන් සහ එක් එක් විෂයයකට නියමිත ලකුණු ගණන මෙහි පහත දක්වේ. අශෝභන අත් අකුරු සහ අක්ෂර වින්‍යාසයේ වැරදි වලට සියළුම උත්තර පත්‍රවලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස ලියන අයදුම්කරුවන් නුසුදුස්සන් වීමට ඉඩ තිබේ :—

| | 1 වැනි කොටස | ලකුණු |
|---|---|---|
| 1. | භාෂාව සහ වාක්‍ය රචනය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1* | 150 |
| 2. | සාමාන්‍ය සහ ප්‍රාදේශීක දැනීම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1 ... ... ... ... | 100 |
| 3. | එකතු කිරීම ඇතුළුව අංක ගණිතය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1 ... ... ... ... | 100 |
| 4. | සාමාන්‍ය බුද්ධිය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) විනාඩි 45 ... | 100 |
| 5. | කියවන විට ලිවීම (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ... | 100 |
| 6. | භූගෝල විද්‍යාව (ලංකාව සහ ලෝකය) *(සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) පැය 1 ... ... ... | 100 |

*කවුන්ටර රාජකාරිවලට අදළ " තැපැල්මඟ " නමැති සංග්‍රහයේ සහ තැපැල් කාර්යාල ව්‍යවස්ථාවල දක්වෙන දෙපාර්තමේන්තු කාර්ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද සකස් කරනු ලැබේ. සියයට 50හේ වෙන් කළ පුරප්පාඩු සඳහා තරඟ කිරීමට සුදුසුකම් ඇති තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි නියුක්ත සියළුම නිලධාරීන්ට, විවෘත තරඟ පරීක්ෂණයට මෙන් ම සීමිත තරඟ පරීක්ෂණයට ද භූගෝල විද්‍යාව (ලංකාව හා ලෝකය) වෙනුවට මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට ඉඩ දෙනු ලැබේ.

**සැලකිය යුතුයි.**—5 වැනි ඡෙදයේ (අ) (ii) යටතේ සඳහන් සේවකයින් පමණක් හැර තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයෙහි නියුක්ත සියළුම සේවකයින් භූගෝල විද්‍යාව (ලංකාව සහ ලෝකය) ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

| 2 වැනි කොටස | ලකුණු |
|---|---|
| සම්මුඛ පරීක්ෂණය ... ... ... | 100 |
| (අයදුම්කරුවන් මුළු විභාගයට පෙනී සිටින භාෂාවෙන් මෙය පවත්වනු ලැබේ). | |

16. මෙම විභාග කොටස් දෙකකින් යුක්තව පවත්වනු ලැබේ. පළමු වැනි කොටස මුලින් ම පවත්වා එහි ප්‍රතිඵල අනුව ලකුණු පිළිවෙලන් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලැබේ. ඔවුන්ට දැනුම් දෙනු ලබන දිනයක එය කොළඹ දී පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය අත් හැරීමට ද ඉඩ තිබේ.

17. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ නිලධාරීන්ගේ පත්වීම්.**—සාමර්ථ්‍යයලත් අයදුම්කරුවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර පුරප්පාඩු ඇති වන පරිද්දෙන් ඔවුනට පත්වීම් දෙනු ඇත.

18. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුලින් ම පළ කොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කරන පත්කිරීම් වලට අදළ පොදු කොන්දේසි බලනු මැනවි.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

1969, ජූලි මස 11 වැනි දින,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ කාර්යාලය,
6 වැනි මහල, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොළඹ 1.

(III) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(IV) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලැජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාග ශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාග ශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(V) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(VI) තමන් පාවිච්චි කරන සෑම කඩදසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙපැත්තේ ම පැහැදිලි ව ද, පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක රූලක් වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(VII) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිම යුතුයි.

(VIII) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(IX) ගණිත ප්‍රශ්න වලට උත්තර සපයන විට ගණන් බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු ක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාල ව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරු වලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊලඟ පිටු වලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(X) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලේ නො ගැලවී යන පරිදී එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(XI) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(XII) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

කේ. වී. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය,

7-801—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව

### වතු ඖෂධ සංයෝජකයන් අනුමත කිරීම සඳහා විභාගය

වතු ඖෂධ සංයෝජකයන් ලෙස අනුමැතිය ලැබීමට කැමති අය සඳහා විභාගයක් 1969 අගෝස්තු මස 25 වැනි දින වෛද්‍ය විද්‍යාපීඨයේදී පවත්වනු ලැබේ.

### අයදුම්පත්

2. විභාග අයදුම්පත් 1969 අගෝස්තු 8 වන දින දහවල් 12 ට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරි, ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව, කින්සි පාර, කොළඹ 8 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

අයදුම්පත් පහත සඳහන් අන්දමට එවිය යුතුයි.

3. අයදුම්කරුවන් තම අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් දෑ සනාථ කළ යුතුයි :—

(1) පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකිරීමෙන් හෝ ලාංකික පුරවැසියෙක් බව,

### කහටගස් දිගිලිය නි. මි. යෝ. ක්‍ර. ගබඩාව ඉදිකිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස් දිගිලියේ නි. මි. යෝ. ක්‍ර. ගබඩාව ඉදිකිරීම සඳහා 1969 අගෝස්තු 8 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 අගෝස්තු මස 7 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර්පත්‍ර එවීමට හැකි වන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. ති. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූලි මස 18 දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

7–826—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පුත්තලම උප කොටස

පුත්තලම උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1969 ජූලි 29 වැනි අඟහරුවාදා පෙ.ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

| අංකය | වැඩවල නම | ලියාපදිංචි වියයුතු ගණන් රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | මාසයට වැඩ කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 ... | කඩවලවැවේ වම් සහ දකුණු ඇලවේලි ප්‍රකෘතිමත් කිරීම සහ වම් සොරොව් ඇල වැඩිදියුණු කිරීම | 15,000 ... | 25 ... | සියයට 50 යි |
| 2 ... | කඩවලවැවේ දෙබඩි කම්කරු නිවාසයක්, ලිඳක් සහ වැටක් තැනීම ... | 28,000 ... | 50 ... | සියයට 50 යි |

1. මෙම දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ඒ ඒ ගණන්වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට සහ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

2. 1969 ජූලි 18 වැනිද සිට ජූලි 25 වැනි දින දක්වා සාමාන්‍ය කායර්‍යාලීය වේලාවන් තුළදී පුත්තලම, නිකවැරටිය, උප කොටස් භාර වාරිමාර්ග කායර්‍යාල වලින් ලබා ගතහැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කල යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම කොල නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් ඒ ඒ ගණන්වලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන් සියක් ඉදිරිපත් කල යුතුය.

3. මේ ටෙන්ඩර් ගැන සියලු විස්තර කායර්‍යාලීය වේලාවන් තුල දී පුත්තලම උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ක. මු. සුප්‍රමානියන්,
වාරිමාර්ග ඉංජිනේරු, පුත්තලම.

1969 මැයි මස 18 වැනි දින,
වාරිමාර්ග කායර්‍යාලය, පුත්තලම.

7–444—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සීතාඑළිය සහ රහංගල ගොවිපලවල හිස් අර්තාපල් පෙට්ටි විකිණීම**

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් සීතාඑළිය සහ රහංගල ගොවිපලවල ඇති පහත සඳහන් ප්‍රමාණයේ හිස් අර්තාපල් පෙට්ටි විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1969.8.1 වෙනි දින ප. ව. 2 වන තෙක් භාරගනු ලැබේ.

**විකිණීමට ඇති අර්තාපල් පෙට්ටි ප්‍රමාණය :—**

සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපල හිස් අර්තාපල් පෙට්ටි 4,2000 යි

රහංගල බීජ අර්තාපල් ගොවිපල හිස් අර්තාපල් පෙට්ටි 30,000 යි

හිස් අර්තාපල් පෙට්ටි විකිණීම සඳහා තෝරා ගනු ලබන ටෙන්ඩර් කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලත ඒ ඒ ගොවිපලේ ඇති සම්පූර්ණ අර්තාපල් පෙට්ටි ප්‍රමාණයම ගොවිපලේ කළමනාකරු වන්ට එකවර මුදල් ගෙවා භාරගෙන එකී ගොවිපලවලින් පිටත ගෙන යා යුතුය.

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිගෙන් ලබාගන්නා ලද පෝරමවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුතුව එවිය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා 'පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති' නමට එවිය යුතුය. කවරයෙහි ඉහළ වම් කෙළවරේ "සීතාඑළිය සහ රහංගල ගොවිපලවල හිස් අර්තාපල් පෙට්ටි මිළට ගැනීම" කියා සඳහන් කළ යුතුය.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම ලබාගත හැක. 1969 ජූලි මස 31 වෙනි දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඕනෑම දිසාපති කාර්යාලයක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. දිසාපති කාර්යාලයක මුදල් තැන්පත් කළ යුත්තේ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ ගිණුමටය. ගිවිසුම් පත් අත්සන් කළ පසු මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 10 ක් ඇතුලත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිනි නම් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩ කළ අයගේ ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට යම් මුදලක් අය වීමට ඇතොත් ඒ එය අය කර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත පුද්ගලිකව පැමිණ අතින්ම භාර දිය හැක. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම ලේඛනගත තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින සිට දින 4 ක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණිනම් ඒ බව පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින් වහාම දැන්විය යුතුය.

5. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුට පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින එකී වේලාවට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතුය. යම් වෙනසක් සිදුකළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය.

7. ටෙන්ඩර්කරුවන් තම නම පැහැදිලිව ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

8. ටෙන්ඩර් විවෘත කොට සති තුනක් ගත වන තුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

9. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමටත්

පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිම වූ විට පමණි. පත් කර ගත් ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් වනවා ඇත.

10. ශිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුය.

11. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා සතුය.

12. පුද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාර දෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් ලිපිනයට ලේඛනගත තැපැලෙන් යවන ලද ලිපි හෝ ටෙන්ඩර්කරු අතට පත් කළා සේ සලකනු ලැබේ.

13. වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ නම් තනිව හෝ වෙනත් අයකුගේ නම සමග හෝ ඇතුළුවී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. විකිණීමට ඇති මෙම අර්තාපල් පෙට්ටි සීතාඑළිය සහ රහංගල ගොවිපලවලදී කාර්යාල වේලාවන් තුළදී පමණක් පරීක්ෂාකර බැලිය හැක. මේ පිළිබඳ වැඩි විස්තර මෙම ගොවිපල කළමනාකරු වන් හමුවී දැන ගත හැක.

15. මෙම අර්තාපල් පෙට්ටි සම්පූර්ණ ප්‍රමාණයම හෝ ඉන් කොටසක් හෝ විකිණීමේ සම්පූර්ණ වගකීම කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා සහ බණ්ඩාරවෙල කෘෂිකර්ම නිලධාරී තැන සතුය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(කෘ. අධ්‍යා. හා ගොවිපළ).

කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල කාර්යාලය,
පේරාදෙනිය,
1969 ජූලි මස 1 වෙනි දින දීය.

7–610—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කරදියන් ආරු ගොවිපලෙහි ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම හා ගොඩගැසීම සහ රජයේ ගොවිපලවලට ද්‍රව ඉසිනයන් දෙකක් හා ඉරු දෙකේ පොල් අතු සැපයීම හා ගෙනවිත් භාරදීම**

ඉහත සඳහන් දේ සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 අගෝස්තු මස 1 වෙනි දින පෙ. ව. 10 දක්වා යාපනයේ, කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි) විසින් භාරගනු ලැබේ.

(අ) කරදියන් ආරු ගොවිපලෙහි (මඩකලපුව දිස්ත්‍රික්කය) අක්කර 20 ක ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම සහ ගොඩ ගැසීම.

ගොවිපලෙහි කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් නියම කරනු ලබන ස්ථානවල ගොයම්කොළ ගොඩ ගැසිය යුතුයි. වී ඇට වලට හානි පැමිණීමට ඉඩ නොතැබිය යුතු අතර, කුඹුරෙහි ඉතිරිවන ඉපනැල්ලෙහි උස අඟල් 6 කට නොවැඩි විය යුතුයි.

ගොවිපල කළමනාකරු විසින් නියම කරනු ලබන නියමිත වකවානුව තුළ ගොයම් කැපීම නිමකළ යුතු අතර, නියමිත දිනය ඉක්මවා පමා වන එක් එක් දිනය උදෙසා දඩයක් ගෙවීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ. සියළුම කටයුතු ගොවිපලේ කළමනාකරු සෑහීමට පත්වන පරිදි නිම කළ යුතුයි. දිනකට අඩුම වශයෙන් අක්කර හතරක (4) ගොයම් කැපිය යුතුයි. සතිපතා ගොයම් කැපිය හැකි නියමිත අක්කර ගණන දැක්විය යුත්තේ ටෙන්ඩරය භාරගන්නා අවස්ථාවේදී කැපීමට ඇති ගොයම්වල තත්ත්වය අනුවය. කපන ලද ගොයම් වැස්සෙන් බාධාවක් නොපැමිණිය හොත් කපාගත් දින සිට දින දෙකක් තුළ ගොඩ ගැසිය යුතුයි. වැස්සෙන් බාධාවක් ඇතිවුව හොත් ගොයම්කොළ කොතනක ගොඩගැසිය යුතුදැයි ගොවිපල කළමනාකරු විසින් තීරණය කරනු ඇත. කොන්ත්‍රාත්කරුගේ නොසැළකිල්ලෙන් වී වලට හානියක් සිදු වේ නම් එම හානියේ වටිනාකම ඔහුගෙන් අයකරගනු ලැබේ. වැඩය ජූලි මස අවසාන හරියේදී ආරම්භකර 69.8.31 වෙනි දිනට හෝ ඊට පෙර නිමකළ යුතුයි. අක්කරයකට අයකරණ මිල ගණන් දැක්විය යුතුය. සියළුම කාර්යයන් ගොවිපල කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් අණකරන අන්දමට ඔහු සෑහීමට පත්වන පරිදි නියම කරන ලද දිනයකදී නිම කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ. වැඩය පටන් ගන්නා නියමිත දිනය ගොවිකළමනාකරු විසින් තීරණය කර දන්වනු ලැබේ.

(ආ) පරන්තන් ගොවිපලට ද්‍රව ඉසිනයන් දෙකක් සැපයීම හා ගෙනවිත් භාරදීම.

වායු සමණය වූ බලයෙන් ක්‍රියා කරන ද්‍රව ඉසින දෙකක් හා කුඩු ඉසින රාත්තල් 30 ට වඩා බර නොමැති ගැලුම් දෙකකට නොඅඩු ද්‍රව හා රාත්තල් 11 කට නොඅඩු කුඩු ප්‍රමාණයක ධාරිද්‍රතාවයක් ටැංකියක් ඇති සියල්ල පූර්ණ වක් එක් ඉසිනයක්.

ඉසින පරිමාව චතුරකාරයකින් පාලනය විය යුතු අතර තිරස්තරව ඉසීමේදී විනාඩියකට ඉසින වේගය ගැ. 1/8 සිට $\frac{1}{2}$ දක්වා විය යුතුයි. දියර ඉසීමේ සඵලතාවය යාර 10 කට නොඅඩු විය යුතු අතර කුඩු ඉසීමේ සඵලතාවය යාර 30 කට නොඅඩු විය යුතුයි. ඉසිනයට අවශ්‍ය ආයුධ පෙට්ටි වැනි අමතර කොටස් වලින් යුක්ත විය යුතුයි.

ටෙන්ඩර්කරු ඉහත සඳහන් විස්තර වලට අනුකූලව ද්‍රව ඉසිනයන් දෙකක් සැපයිය යුතුයි. ගෙවීම් කරනු ලබන්නේ සපයන ලද ඉසිනයන් ගොවිකළමනාකරුගේ සෑහීමට පත්වන පරිදී හොඳාකාර ක්‍රියාත්මකකර බැලීමෙන් පසුය. ටෙන්ඩර දෙකක් සමග සැපයීමට බලාපොරොත්තුවන ඉසිනයන් සම්බන්ධ විස්තර හා උපදෙස් මාලාවන් ද සැපයිය යුතුයි. මිල ගණන් දැක්විය යුත්තේ ඉසිනයන්ට හා උපකරණ වලටද සමගය.

ටෙන්ඩරය භාරගත් බව දන්වා මාස දෙකක් තුළදී ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ගබඩාවල ඇති ඉසිනයන්ගෙන් සපයා ගෙනවිත් භාරදිය යුතුයි.

(ඇ) පහත සඳහන් රජයේ ගොවිපල වලට ඉරුදෙකේ පොල් අතු සැපයීම හා ගෙනැවිත් භාරදීම.

| | | |
|---|---|---|
| රජයේ ගොවිපල, යාපනය | ... | 750 යි |
| රජයේ ගොවිපල, කිලිනොච්චිය | ... | 4,500 යි |
| රජයේ ගොවිපල, වව්නියාව | ... | 2,500 යි |
| රජයේ ගොවිපල, මුරුන්කන් | ... | 2,500 යි |
| රජයේ ගොවිපල, ත්‍රිකුණාමලය | ... | 500 යි |
| රජයේ ගොවිපල, කරදියන් ආරු | | 3,500 යි |

පොල් අත්තක් අඩි 6කට වඩා දිගින් ද, අඟල් 13 කට පවා පළලින් ද තිබිය යුතුයි. සැපයීම සහ ගෙනවිත් භාරදීම 69.8.31 වෙනි දිනට හෝ ඊට පෙර නිම කළ යුතුයි. අවශ්‍ය වන නියමිත දිනය ගොවිපල කළමනාකරුවන් විසින් දන්වනු ඇත. පොල් අතු සියයකට අයකරණ මිල ගණන් දැක්විය යුතුයි.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) ගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ

(ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා නි.) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කාර්යාලයේ (ගො. පා. හා නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර්කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර්කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම්පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර්පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම්පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතු වේ. එහෙත් ඒසින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම් වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදාළ දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන්වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිළධාරි (ගො. පා. හා නි.) තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් ෆෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර සියළුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළයුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන්කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනුලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් සියයට 5 ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩකටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධි විධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුල භාරගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිළධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිළධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ තමාට සැහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගතහැක.

පී. වී. ජිනේන්ද්‍රදාස.
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේදීය.
69. 7. 4.

7–604—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මාන්කුලම් පොලිස් ස්ථානය ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය

ඉහත සඳහන් සේවය සඳහා 69.8.1 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.7.31 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ඊසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ කෙළවරේ "මාන්කුලම් පොලිස් ස්ථාන ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කොට, කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන්වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.8.1 වන දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩරකරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම් හා දක්ෂතාවය ටෙන්ඩර් පෝරම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතු වේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිවි/2/376
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ, 69.7.11.

7–793—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### රත්මලානේ අර්ධ-ස්ථිර හා අනිකුත් ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය

ඉහත සඳහන් සේවය සඳහා මොරටුව නගර සභාවේ විදුලි ස්ථාපන කටයුතු සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් 69.8.1 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.8.1 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ඊසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ කෙළවරේ "රත්මලානේ අර්ධ-ස්ථිර හා අනිකුත් ගොඩනැගිලිවල විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කොට, කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන්වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.8.1 වන දින පෙ. ව. 11.30ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම් හා දක්ෂතාවය ටෙන්ඩර් පෝරම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතු වේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිවි/2/381
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ, 69.7.11.

7–792–69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

ජාතික පොලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මහජන වෙළඳ සැලට පහත සඳහන් ප්‍රමාණයේ පොලිතීන් බෑග්ස් සැපයීම සඳහා මිල ගණන් කොළඹ 1, වැතැම් විදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.8.1 දින අ. භා. 2.30 දක්වා බාර ගනු ලැබේ.

(1) ගේජ් 250 14"×15" බෑග් 10,000

(2) ගේජ් 250 14"×19" බෑග් 20,000

වැඩි විස්තර හා මිල ගණන් ඉල්ලුම් පත් කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇම්. ඩී. ඩබ්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.7.10 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

7–738—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### වැලිමඩ ජලසම්පාදන යෝජනා ක්‍රමය

වැලිමඩ ජලසම්පාදන ක්‍රමයෙහි මූලස්ථාන ලිඳ, සේවා ජලාශය, ක්ලෝරිනේටර ගෙය, පොම්පකිරීමේ නල, බෙදාහැරීමේ ක්‍රමය නිර්මාණය කිරීම සහ පොම්ප 2 ක් හා ක්ලෝරිනේටරය සවිකිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර, රත්මලාන, ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් 19 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘතිපත්‍ර මගින් පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධවූ සියලු විස්තර හා තොරතුරුද ඉහත කී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර මෙයට අදාළ සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලාගත හැකි වන්නේය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ", "බී" හෝ "සී" කාණ්ඩයේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හෝ සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්ද පමණක් පහත සඳහන් ලියකියවිලි 1969 සැප්තැම්බර් 5 වෙනි දින දහවල් 12ට පෙරාතුව ඉහත කී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය:—

(අ) ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි; හා

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් දෙසිය පණහක් (රු. 250) තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා යෝජිත වැඩය භාර ගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත්, සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කාර්යාලය හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනර්,
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ වැඩ බලන අධ්‍යක්ෂක.

පළාත් පාලන අමාත්‍යාංශයේ,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන, 1969 ක්වූ ජූලි මස 11 වෙනි දිනදීය.

7–841—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ල සඳහා මගින් ගෙන යන විදුලි සෝපානයක් සපයා ඉදි කිරීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්‍ය්‍ය කර බාරදීම සඳහා ටෙන්ඩර්පත්‍ර වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්ද පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලසි. වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 8 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 11 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ ජූලි මස 18 වෙනි දින දිය.

7–735—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 8 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට හයිටෙන්සයිල් වයර් රෝප් 145 ක් සපයා භාරදීම සඳහා ප්‍රාදේශීය නියෝජිතයින්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන එය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්‍ය්‍යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්‍ය්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 සැප්තැම්බර් මස 6 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1969.7.11.

7–837—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 අගෝස්තු මස 17 වෙනි ඉරිදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ වඩු මඩුවට මිල්ල වක් අතු 100 ක් සපයා භාරදීම සඳහා ප්‍රාදේශීය සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1969 අගෝස්තු මස 17 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායාර්ලයේදී පරීක්ෂාකළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් සභා කායාර්ලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 අගෝස්තු මස 15 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ආර්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1969.7.11.

7–838—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරනලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල ", කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

6. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි ''සී'' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. බඩු බාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

1969 ජූලි 9 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 3. උනවටුන රජයේ රෝහල ... | 100... | 800 | 69.8.11 දින පෙරවරු 10ට | 170... | 170... | 170... | 650... | 1,700... | 1,700... | 1,700... | 7,000 |

7-72—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 8 වැනි දින පෙ. ව. 10.30 දක්වා මෙහි පහත දැක්වෙන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ :—

| විද්‍යාලයේ නම | වැඩ විස්තරය |
|---|---|
| 1. මො/මොණරවාන යෝජිත පාසැල ... | පන්තිකාමර ගොඩනැගිල්ලක් තැනීම. |
| 2. මො/බදුල්ලගම්මන යෝජිත පාසැල ... | පන්තිකාමර ගොඩනැගිල්ලක් තැනීම |

සංලක්‍ෂ්‍යය.—මො = මොණරාගල දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ එක් එක් වැඩය සඳහා රු. 100 ක මුදලක් තැන්පත් කර, එම කුවිතාන්සිය මොණරාගල, ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීමෙන් 1 වැනි වැඩය සඳහා රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ද, 2 වැනි වැඩය සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ද අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට 1969 අගෝස්තු මස 7 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 ක අඩු වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේ විවුවර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය කාර්යාලයයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ, ඌව ප්‍රදේශයේ (බණ්ඩාරවෙල) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ මොණරාගල ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැන ගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ විවුවර, නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

3. දෙ වැනි ඡෙදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචි වී ඇති අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මෙම වැඩ සඳහා එවිය හැක. අනුමත කළ සමිති, ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය. ඔවුන්, දෙ වැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් කළ පරිදි, ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව, මොණරාගල ප්‍රධාන අධ්‍යාපන නිලධාරී තැනගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ෆෝර්මවල ඉදිරිපත් කළ යුතු ය. මේ සම්බන්ධ සියලු විස්තර මොණරාගල අධ්‍යාපන කාර්යාලයෙන් දැන ගත හැකි ය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්, ලියාපදිංචි කළ තැපැලෙන්ම බණ්ඩාරවෙල, ප්‍රාදේශීය අධ්‍යාපන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත්, කවරයක බහා මුද්‍රා තබා, වැඩයේ විස්තර සහ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිත තැන විසින් පෞද්ගලිකව බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයයේ, ප්‍රධාන ලිපිකරු වෙත භාර දී, එසේ භාර ගත් බවට ලියවිල්ලක් ඔහුගෙන් එවේලාවේ ම ලබා ගත යුතු ය.

5. 1969 අගෝස්තු මස 8 වැනි දින පෙ. ව. 10.30 ට බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක කායසීලයේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටැන්ඩර් කරුවන්ට, ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටැන්ඩර් විවෘත කරන නිළධාරී තැන විසින් ටැන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටැන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටැන්ඩර්කරුවන් කැමති විය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මොණරාගල අධ්‍යාපන කායසීලයෙන් ලබාගත හැකි ය. ටැන්ඩර් ලියවිලි පරික්‍ෂාකර බැලීම සඳහා මෙම කායසීලයේ තබා ඇත.

8. ටැන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී, 1966.9.30 වැනි දිනට පෙර, අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටැන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. ඒ. මීගොඩ,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරි,
මොණරාගල.

1969 ජූලි මස 7 වැනි දින,
මොණරාගල,
අධ්‍යාපන කායසීලයේදී ය.

7-722—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 8 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. බ/මොරකැටිය යෝජිත පාසැල | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 2. බ/එගොඩවෙල විදුහල ... | වහළ අළුත්වැඩියා කිරීම |

සංලක්‍ෂය—බ = බදුල්ල දිස්ත්‍රික්කය

අවශ්‍ය ලියාපදිංචිය.—1. රු. 25,000 හෝ ඊට වැඩි. 2. රු. 10,000 හෝ ඊට වැඩි.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පරිදි හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්ත

දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 8 වැනි දා පෙරවරු 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්‍යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වේනොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්‍යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්‍යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
කුරුණෑගල ප්‍රදේශයේ වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූලි මස 9 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්‍යාලයේ දී ය.

7–710—69.7.18 දින අංක 14,863 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/22/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඇප්ලිකේෂන් බෙන්සයිල් බෙන්සොයේට් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඇප්ලිකේෂන් බෙන්සයිල් බෙන්සොයේට් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(I) අංක 14,843 දරණ 1969 පෙබරවාරි මස 28 වැනි දිනැති ''රජයේ ගැසට් පත්‍රයේ'' පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(II) ලන්ඩනයේ රාජ්‍ය නියොජිතයින්,

(III) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(IV) ඔස්ට්‍රේලියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යූගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584 දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969. 9. 16 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදළ ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(I) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(II) I වැනි ඡෙදයේ IV වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1969.7.7

### අදල උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements lbs.* | *Packing required* |
|---|---|---|---|
| 1 | Application Benzyl Benzoate B. P. | 15,000 | In 1 lb. leak-proof wide mouth bottles. |
| 1(*a*) | do. | 35,000 | In 5 lb. leak-proof wide mouth bottles. |

7–615—69.7.18 දින අංක 14,863 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම, කිලිටි රෙදි සේදීම හා අයිතිවාසිකම් නොකියන ලද මළ සිරුරු අස්කිරීම හා වැලලීම—රත්නපුර මහ රෝහල—1969/70 මුදල් වර්ෂය

1969.6.20 දින හා අංක 14,859 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් සේවාවන් ඉටුකිරීම සඳහා ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයන් පහත පෙනෙන පරිදි දීර්ඝ කරන ලදී.

| සේවාව | ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරන අවසාන දිනය | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. පිසූ ආහාර සැපයීම | 69.7.29 දින දවල් 12.00 දක්වා | 69.7.30 දින දවල් 12.00 |
| 2. කිලිටි රෙදි සේදීම | 69.8.1 දින දවල් 12.00 දක්වා | 69.8.2 දින දවල් 12.00 |
| 3. අයිතිවාසිකම් නොකියන ලද මළසිරුරු වැළලීම | 69.7.30 දින දවල් 12.00 දක්වා | 69.7.31 දින දවල් 12.00 |

වැඩි විස්තර සඳහා 1969.6.20 දින හා අංක 14,859 දරණ ගැසට් පත්‍රය බලන්න.

වෛද්‍ය එස්. ජී. කුලතිලක,
සෞඛ්‍ය සේවා අධිකාරී,
රත්නපුර.

7–705—69.7.18 දින අංක 14,863 දරණ ගැසට් පත්‍රය

බලපත්‍ර අධිකාරීගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. හොණ්ඩර 20ක් හෝ හොණ්ඩර 40ක හෝ ලොරියක් අවශ්‍යවූ විට එය සැපයීමට ටෙන්ඩර්කරුට අපහසු නම් ඒ වෙනුවට වැඩි බර ප්‍රමාණයක ලොරියක් යොදවා අවශ්‍ය බර ප්‍රමාණයට පමණක් ගාස්තුව ලබා ගන්නා බවටද ටෙන්ඩර්කරු ලියවිල්ලකින් පොරොන්දු විය යුතුය.

ලොරිවල අයිතිය හා ටෙන්ඩර් තැන්පත් මුදල් පිළිබඳ නියමයන් ගෙන් ලියාපදිංචි කරනලද සමුපකාර සමිති නිදහස් වේ.

ටෙන්ඩර්කරුවන් මෙම සේවය යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගත යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවාගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

ඉහත සඳහන් සේවාව භාරගෙන එය සතුටුදායක අන්දමින් ක්‍රියාවේ යෙදවීමට ටෙන්ඩර්කරුට ධන ශක්තිය ඇති බවට ලියවිලි ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් කොන්දේසි හා පොදු කොන්ත්‍රාත්තු කොන්දේසි සමග ටෙන්ඩර් පත්‍ර මුද්‍රාතබා සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ලංකා දුම්රිය සේවය, තැ. පෙ. අංක 355, රේල්වේ ඇවනියු, කොළඹ 10 කියා ලිපිනය යොදා ලියාපදිංචි කරන ලද තැපෑලෙන් 1969 අගෝස්තු මස 8 වෙනි සිකුරාදා පූ. භා. 11 ට ප්‍රථම ලැබීම පිණිස එවිය යුතුය. නො එසේ නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ටෙන්ඩර් පත් ඇතුලත් මුද්‍රා තැබූ කවරයේ පිට පැත්තේ සේවා විස්තර සඳහන් කර, එවැනි ටෙන්ඩර් භාරගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් බලය පවරණ ලද නිලධාරියාට භාරදී එය ලැබුණු බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

ටෙන්ඩර් පත් 1969 අගෝස්තු මස 8 වෙනි සිකුරාදා අ. භා. 2.15ට කොළඹ 10, රේල්වේ ඇවනියුහි, තැ. පෙ. අංක 355, ලංකා දුම්රිය සේවයේ ටෙන්ඩර් මණ්ඩලයේදී සභාපති විසින් විවෘත කරනු ලැබේ. එම වේලාවට එහි පැමිණ සිටීමට කැමති ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

තැ. පෙ. අංක 355,
කොළඹ 10,
1969 ජූලි මස 10 වෙනි දින.

7–720—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. එම්. 1505 (2).

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩය සඳහා 1969 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | | ලියාපදිංචි වියයුතු මුදල |
| --- | --- | --- |
| දොඩන්ගොල්ල ජනපද පාර ගල් අතුරා තාර දැමීම | ... | රු. 20,000.00 |

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් වද 1969 අගෝස්තු මස 10 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් ඉල්ලුම් කරන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණකර පිටපත් දෙකකින් යුක්තව ලේඛන ගත තැපෑලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවර වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1969 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී 357 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු සහ නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත් කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථා වලදී ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේ ස්ථිර, ලේකම්ගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නක් එකී පාඨයට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්වේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරන වූ ද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු එකඟවිය යුතුයි.

කොන්ත්‍රාත් කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම් කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරට්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධිමත් පරිදි බලා දෙනු ලැබූ නිල ධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 ජූලි මස 7 වැනි දින,
මහනුවර කච්චේරියේදීය.

7–616—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

පහත සඳහන් උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් කොළඹ 7, 415 බෞද්ධාලෝක මාවත, ග. නි. ස. ම. මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය, සභාපති විසින් 1969 අගෝස්තු 22 දක්වා භාරගනු ලැබේ :—

(1) කොන්ක්‍රීට් වෛබ්රේටර

(2) කොන්ක්‍රීට් මික්සර්

(3) ඩම්ප් ට්‍රක්,

2. රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කාර්යාලයට ගෙවා 1969 අගෝස්තු 16 දින හෝ ඊට පෙර කාර්යාල වේලාවන් හිදී ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්වල දෙපිටපතකින් ටෙන්ඩර් කළ යුතුය.

වැඩි විස්තර ඉහත කාර්යාලයෙන් ලබා ගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

කොළඹ 7,
1969 ජූලි 8 දින.

7–661—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## මහජන බැංකුව

### ටෙන්ඩර් දැන්වීමයි

බලංගොඩ මහජන බැංකු ශාඛා ගොඩනැගිල්ලක් සහ කළමනාකාර නිවාසයක් ඉදි කිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

පසුගිය වසර දෙක ඇතුළත රුපියල් 1,50,000 හෝ ඊට වැඩි අගය ඇති තනි ගොඩනැගිල්ලක් සතුටුදායක ලෙස නිම කළ බවට සාක්ෂි, වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ප්‍රැන්ක් එස්. පීරිස් මහතා වෙත ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන්ට හැකි වියයුතුයි. ගෘහ නිර්මාණ ශිල්පී වෙත සුදුසුකම් පිළිබඳව සාක්ෂි සතුටුදායක ලෙස ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවනට පමණක් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

කොළඹ 7, විජේරාම මාවතේ, අංක 27 දරණ ගොඩනැගිල්ලේ පිහිටි පරිශ්‍ර දෙපාර්තමේන්තුවේදී, කාර්යාල වේලාවන් හි මෙම ගොඩනැගිලි පිළිබඳ අඟල් $\frac{1}{8}$ පරිමාණ සැලසුම් $\frac{1}{4}$'' හා $\frac{1}{2}$'' සවිස්තර සැලසුම්පත් ඇතුළත් සියලුම සැලසුම් පත් කොන්ත්‍රාත්කරුවනට අවශ්‍ය වේ නම් බලා ගතහැක.

කොළඹ 7, විජේරාම මාවතේ, අංක 25 ඒ දරණ ස්ථානයේ ගෘහ නිර්මාණ ශිල්පී ප්‍රැන්ක් එස්. පීරිස් මහතා විසින් 1969 ජූලි මස 19 දින සිට 1969 අගෝස්තු මස 2 දින දක්වා කාර්යාලයීය වේලාවලදී ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. අඟල් $\frac{1}{8}$ පරිමාණ සැලසුම්, ප්‍රමාණාත්මක සැලසුම්, සවිස්තර සැලසුම් සහ සම්භාර බිල්පත් වෙනුවෙන් රු. 50 ක ටෙන්ඩර් ගාස්තුව ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල ආපසු දෙනු නො ලැබේ. විස්තර සැලසුම් ලබා ගැනීමට කැමැති අය අමතර රු. 100 ක ගාස්තුවක් ගෙවා ගෘහ නිර්මාණ ශිල්පීන් ගෙන් ඒවා ලබා ගත යුතුය.

සියලුම ටෙන්ඩර් පත් හෝ ඕනෑම ටෙන්ඩර් පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.

" බලංගොඩ මහජන බැංකු ශාඛාව සඳහා ටෙන්ඩර් පත " යනුවෙන් සඳහන් කොට මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්, කොළඹ 7, විජේරාම මාවතේ, අංක 27 දරණ ස්ථානයේ මහජන බැංකුවේ සැපයීම් හා පරිශ්‍ර නිලධාරි තුමා වෙත 1969 අගෝස්තු මස 10 දින සවස 4.30 ට පෙර ලැබිය යුතුය.

සැපයීම් හා පරිශ්‍ර නිලධාරි.

මහජන බැංකුව,
අංක 27, විජේරාම මාවත;
කොළඹ 7.
1969. 7. 8.

7–663—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය—නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### මහියංගන පූජ්‍ය නගර සැළසුම් යෝජනා ක්‍රමය—දියදෝරු ක්‍රමයට ඉදිකෙරෙන වැසිකිළි

මහියංගන දියදෝරු ක්‍රමයට වැසිකිළි පේලි හයක් ඉදිකිරීම සඳහා කොළඹ 10, ඞී. ආර්. විජේවර්ධන මාවතේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1969 අගෝස්තු මස 4 වැනි දින පෙරවරු 10 දක්වා, පිටපත් දෙකකින් යුත්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ. එදිනම නගර හා ග්‍රාම නිර්මාණ අංශයේදී පෙරවරු 10.15 ට ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, ඞී. ආර්. විජේවර්ධන මාවතේ නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල විය යුතුය. රු. 1,25,000 කට නොඅඩු වැඩ සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වී සිටින අයට එසේ ලියා පදිංචිවීම පිළිබඳව සාක්ෂි සහ ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100, කොළඹ 1, " හේමාස් " ගොඩනැගිල්ලේ පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ කොළඹින් පිටත තිබෙන ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට 1969 අගෝස්තු 3 වන දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනවා ඇත.

3. ඉහත සඳහන් 2 ඡේදයේ දක්වා ඇති මුදලට ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වී ඇත්නම් අනුමතින සමිති සමාගම් වලටද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. එබඳු සමිති සමාගම් ටෙන්ඩර් තැන්පත් මුදලෙන් නිදහස්ය.

4. සියළුම ටෙන්ඩර් සීල් තබා කවරයෙහි වම් පැත්තේ මුදුන් කෙළවරෙහි " මහියංගන දියදෝරු ක්‍රමයේ වැසිකිළි " යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. එසේත් නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ කාර්යාල සහකාර තැනට භාරදී එය භාර ගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

ඇන්. ගුණරත්න,
නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ.

නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඞී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
1969 ජූලි 10 වෙනි දින.

7–824—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය " ටෙන්ඩර් " මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් $1\frac{1}{2}$ කළුගල් කියුබ් 300 ක් වැල්ලවට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 අගෝස්තු මස 15 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීයේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1969 අගෝස්තු මස 1 වැනි දින පස්වරු 4.00 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඞී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,

තැ. පෙ. 370,
කොළඹ.
1969. 7. 9 වැනි දින.

7–760—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

කුරුණෑගල ර. වැ. දෙ. ශාඛා වැඩපොලට අයත් ගොඩනැගිලි තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කුරුණෑගල වයඹ කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති වරයා විසින් වර්‍ෂ 1969 අගෝස්තු මස 8 වැනි සිකුරාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කුරුණෑගල රජයේ වැඩ දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැළැස්ම ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 40,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන, රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්‍ෂ 1969 ජූලි මස 30 වැනි බදාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුවන් විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

6. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇස්. ගනේෂරත්නම්,
අධිකාරී ඉංජිනේරු,
වයඹ කොට්ඨාශය, ර. වැ. දෙ. කුරුණෑගල.

කුරුණෑගල වයඹ කොට්ඨාශයේ,
අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
1969. 7. 18.

7–699—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

පුත්තලම්-ත්‍රිකුණාමල පාරේ 20 වැනි සැතපුමේ ඕවර්සියර් නිවාසයක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කුරුණෑගල අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අගෝස්තු මස 8 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. පුත්තලමේ රජයේ වැඩ දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 41,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන, රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ජූලි මස 30 වැනි බදාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

6. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇස්. ගනේෂරත්නම්,
අධිකාරී ඉංජිනේරු,
වයඹ කොට්ඨාශය, ර. වැ. දෙ. කුරුණෑගල.

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
කුරුණෑගල,
1969 ජූලි 18.

7–700—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

ඇහැටුවැව ර. වැ. දෙ. ඕවර්සියර් නිවාසය තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කුරුණෑගල අධිකාරී ඉංජිනේරු කාර්යාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අගෝස්තු මස 8 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 37,200 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන, රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ජූලි මස 30 වැනි බදාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

අධිකාරී ඉංජිනේරු,
වයඹ කොට්ඨාශය.

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
කුරුණෑගල,
1969. 7. 18.

7–701—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**1969 පෙබරවාරි 25 දින අවසන් කරන ලද මැණීමේ උපකරණ**

**සඳහා වූ ටෙන්ඩර් ප්‍රතිඵල**

| අනු අංක | සේවා විස්තර | ප්‍රමාණය | ලැබුණු ටෙන්ඩර් | පිළිගත් ටෙන්ඩර් පළමු වටිනාකම | පිළිගත් මෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|
| 1. | මැණීමේ ටේප් පටි අඩි 50 ... | 500 ... | 14 ... | ප : 176—1—7 ... | සී :ස : සිලෝන් සහ ෆේපාරින් ට්‍රේඩ්ස් තැ.පෙ. 912, කොළඹ 2. |
| 2. | මැණීමේ දම්වැල් අඩි 100 ... | 250 ... | 9 ... | ප : 373—19—08 ... | සී :ස : සිලෝන් සහ ෆේපාරින් ට්‍රේඩ්ස් තැ.පෙ. 912, කොළඹ 2. |

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1506, කොළඹ 10,
1969 ජූලි 10 දින.

7–757—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පරණ ප්‍රවෘත්ති පත්‍ර හා පරණ ගැසට් පත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1969 ජූලි මස 26 දින පූ. හා. 10.30 ට කොළඹ, ජාවත්ත පාරේ වාරිමාර්ග කායඝිලයේදී පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් 150 ක් පමණ හා ගැසට් පත්‍ර රාත්තල් 150 ක් පමණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේවා ඉතාම වැඩි මිලට ඉල්ලුම් කරණ තැනැත්තාට ලබාගත හැකිය. ඉල්ලුම්කර පත්‍ර ලබාගත් තැනැත්තා ඒ වේලාවේම මුදල් ගෙවා එකී පත්‍ර රැගෙන යා යුතුය.

මෙම පරණ ප්‍රවෘත්ති පත්‍ර සහ ගැසට් පත්‍රිකා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දින උදේ 9.30 සිට පෙ. ව. 10 දක්වා පරීක්ෂා කර බැලීම සඳහා අපේක්ෂකයන්ට ඉඩ සලසා ඇත.

ඇස්. ඇම්. ආරුමුගම්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූලි මස 8 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

7–693—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

ගල්ගමුව අඩවියේ වන අපරාධවලට අයත්, හල්මිල්ල හා තේක්ක යන වර්ගයන්ගෙන් සමන්විත ඝන අඩි 149.9 කින් යුක්ත කඳන් 32 ක්, I වැනි පන්තියේ කනු 21 ක්, II වැනි පන්තියේ කනු 51 ක් සහ ඝන අඩි 9.4 කින් යුක්ත බුරුත ලෑලි 20 ක්, 1969 ජූලි මස 30 දින පෙරවරු 10 ට ගල්ගමුව අඩවි කැලෑ කාර්යාලයේ දී, වයඹ දිසාභාර කැලෑ නිළධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම දැව පරීක්ෂා කිරීමට දැව මිළදී ගැනීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර ගල්ගමුව අඩවි වන නිළධාරිගෙන් හෝ වයඹ දිසා කැලෑ නිළධාරි ගෙන් විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිළධාරී,
කුරුණෑගල.

1969 ජූලි 3 දින,
කුරුණෑගල දිසා කැලෑ කාර්යාලයේදීය.

7–825—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 10, ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ටියුනිසියා මධ්‍ය ගබඩාවේ ඇති වියලි මිරිස් තොගයක්, හොණ්ඩර් 10 යේ (දල බර) තොගවලින් 1969 ජූලි 22 දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම මිරිස්වල සැම්පල් ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාලයීය වේලාවන්හිදී පරීක්ෂාකර බැලිය හැක. (දුරකථන අංකය : 31216)

මෙහිදී මිළයට ගන්නා මිරිස් වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ වටිනාකම ගෙවා එදිනම ගෙනයා යුතුය.

වී. නි. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූලි 10 වෙනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

7–740—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

### පරිහරණයට නුසුදුසු රථවාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත දක්වෙන පරිහරණයට නුසුදුසු රථවාහන හෝමාගම, පනාගොඩ පිහිටි යුද්ධෝපකරණ ගබඩාවේදී 1969 අගෝස්තු මස 3 වෙනි ඉරුදින පෙ. ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| වර්ගය | | මුළු ගණන |
|---|---|---|
| (අ) පෝඩ්සන් තේම්ස් ටොන් 3 ලොරි | = | 05 |
| (ආ) පෝඩ්සන් තේම්ස් (මාටින් හාපර්) ලොරි | = | 03 |
| (ඇ) විලිස් ජීප් (ස්ටේෂන් වැගන්) | = | 01 |

2. අවසාන මිටි පහර පතිතවනවාත් සමග සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, වෙන්දේසි කරනු ලබන දිනම පස්වරු 4 ට පෙර සියළුම භාණ්ඩ යුද්ධෝපකරණ ගබඩාව පෙදෙසෙන් ඉවත් කර ගත යුතුවේ.

3. මෙම වාහන 1969 අගෝස්තු මස 2 වෙනි දින පෙ. ව. 9.30 සිට ප. ව. 3.30 දක්වා කාලය තුළ පහත සඳහන් ස්ථානයේදී පරීක්ෂා කළ හැක :—

යුද්ධෝපකරණ ගබඩාව,
යුද හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

ඩී. ඇස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදා ආඥාපති.

යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553, කොළඹ,

1969 ජූලි මස 7 දින දීය.

7–758—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

අහිමි ලිපි කාර්යාලයට ලැබුන, හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩ වල බහා තිබුණු පහත සඳහන් භාණ්ඩ 1969 ජූලි මස 30 වැනි බදාදා පස්වරු 1.30 ට කොළඹ 3, කොල්ලුපිටියේ, 19 වෙනි පටුමගේ, අංක 20 දරණ ස්ථානයේ, පිහිටි අහිමි ලිපි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ ගණනකට ඉල්ලනු නොලබන භාණ්ඩ විකිණීම අත්හිට වනු ලැබේ.

බී. ඩී. ඇම්. ලියනගේ,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ වෙනුවට.

පෝ. මා. ජ. කාර්යාලය,
තැ. සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ.
1969.7.9.

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| (1) | එකක් රාත්තල් 40 බැගින් වූ පරණ මුද්‍රිත කඩදාසි මලු 35 ක් |
| (2) | පරණ පත්තර හොණ්ඩරයක් |
| (3) | පරණ පත්තර හොණ්ඩරයක් |
| (4) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (5) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (6) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (7) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (8) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (9) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (10) | ඉංග්‍රීසි සඟරා තොගයක් |
| (11) | ඉංග්‍රීසි සඟරා තොගයක් |

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| (12) | ආගමික සඟරා තොගයක් |
| (13) | දෙමළ සඟරා තොගයක් |
| (14) | ඉංග්‍රීසි පොත් තොගයක් |
| (15) | ඉංග්‍රීසි පොත් තොගයක් |
| (16) | ඉංග්‍රීසි නවකථා පොත් හයක්, දෙමළ පොතක් සහ ආගමික පොතක් |
| (17) | ඇඳුම් මෝස්තර පොත් තොගයක් (සිංහල) |
| (18) | " කොඩැක්-ඉන්ස්ටමැටික් " 100 කැමරාවක් |
| (19) | හවරි දෙකක්, බ්‍රැසියර් එකක්, පනාවක්, දත් බුරුසු වක්, සහ දන්තාලේප කැට්ටුවක් |
| (20) | ළමා ඇඳුම් දෙකක්, තුවායක්, නැප්කින් එකක්, රෙදි කැබලි දෙකක්, සහ ලේන්සු දෙකක්. |
| (21) | ආගමික පිළිම තොගයක්, කුඩා බැරෝමීටරයක් සහ කුරුසයක් |
| (22) | සබන් කෑලි 18ක්, පාවිච්චි කළ ගැහැණු කුඩයක් සහ විදුරුවක් |
| (23) | කුඩා ඇත් දත් කැටයමක්, කුඩා පැදුරු 3ක්, සහ කළුවර ලීයෙන් තැනූ ඇතෙක්, |
| (24) | කුඩා කියතක්, සහ බ්ලේඩ් තහඩු දෙකක් සහ, පිස්ටන් වලල්ලක් |
| (25) | පාවිච්චි කළ තැපැල් මුද්දර 15,000 ක පමණ තොගයක් |
| (26) | පාවිච්චි කළ තැපැල් මුද්දර 15,000 ක පමණ තොගයක්. |

7–789—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම

අංක 14,855 හා 1969 මැයි මස 22 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ''කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1969/70 වර්ෂයේ රා තැබෑරුම් විකිණීම'' යන ශීර්ෂය යටතේ ම විසින් පළකරන ලද සියළුම කොන්දේසිවලට යටත්ව පහත සඳහන් රා තැබෑරුම්වල රේන්ද නැවත විකිණීම සඳහා කුරුණෑගල දිසාපති විසින් 1969 අගෝස්තු මස 11 වැනි දින වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | | | | එක් එක් තැබෑරුම් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවල් 1969.8.11 වැනි දින |
|---|---|---|---|---|
| අංක. 1 | ගිරිඋල්ල | ... | ... | පෙරවරු 10.00 |
| අංක. 2 | උඩුබද්දව | ... | ... | පෙරවරු 10.30 |
| අංක. 4 | නාරම්මල | ... | ... | පෙරවරු 11.00 |
| අංක. 6 | කුරුණෑගල | ... | ... | පෙරවරු 11.30 |

හී. බ. දිසානායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජුලි මස 18 වැනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දීය

7–702—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් නැවත විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි පහත සඳහන් රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1969 මැයි මස 30 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මා විසින් පළ කරන ලද නුවරඑළිය දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් විකිනීමේ දන්වීමෙහි සඳහන් නීති රීතිවලට හා කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ

ටෙන්ඩර් පත් 1969 අගෝස්තු මස 4 වන දින පහත උපලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජුලි මස 8 වන දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේදී ය.

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත රා තැබෑරුම්—1969–70

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ග්‍රාමය | විවෘත කරන වේලාව | වසන වේලාව | ටෙන්ඩර් පත් විවෘත කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | කොත්මලේ ... | කඩදෙරපිටිය ග්‍රාමය තුළ ... | පෙරවරු 8.00 ... | පස්වරු 7.00 ... | පෙරවරු 10.00 |
| 2 | කොත්මලේ ... ... | ඕතලාව ග්‍රාමය තුළ ... ... | පෙරවරු 8.00 ... | පස්වරු 7.00 ... | පෙරවරු 10.30 |

7–718—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තබෑරුම් රේන්ද විකිණීම

**කාල සීමාව.**—1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා.

1969 ඔක්තෝබර් 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලය තුළ, පහත සඳහන් පළාත් පාලන ප්‍රදේශ තුළ තැබෑරුම් බල පත්‍රයක් ඇතිව පිටරට බීම (ධාන්‍යවලින් මෙරට නිපද වූ බීම වර්ගත් ඇතුලුව) සිල්ලරට විකිණීමේ සම්පූර්ණ අයිතිය පැවරීම සඳහා ටෙන්ඩර් පත්, පිටරට බීම තැබෑරුම් රේන්ද විකිණීම සම්බන්ධයෙන් 1969.6.20 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ පොදු කොන්දේසිවලට හා දනට බලපවත්නා සියළුම සුරා බදු බලපත්‍ර පිළිබඳ පොදු කොන්දේසිවලට යටත් ව ම විසින් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම නියමිත ආකෘති පත්‍රයේ එවිය යුතු අතර ටෙන්ඩර් තැන්පත් මුදල රු. 500 ක් කච්චේරියක තැන්පත් කර ලබාගත් රිසිට් පතක් හා ඉහත සඳහන් පොදු කොන්දේසිවලට දක්වා ඇති වත්කම් සහතිකය ද අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් පත් දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැක.

3. ටෙන්ඩර් අඩංගු සීල් තබන ලද කවරයෙහි මුදුනේ වම් කෙළවරේ ටෙන්ඩර් කළ තැබෑරුමේ නමත්, එහි අංකයත් පැහැදිලි ව ලියා මෙම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය. නැතහොත් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ දිසාපති, නුවරඑළිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4. සියළු ම තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත් 1969 අගෝස්තු මස 6 වන දින පහත උපලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ. සියළු ම ටෙන්ඩර්කරුවන් එම වේලාවට නුවරඑළිය කච්චේරියේ පෙනී සිටිය යුතු ය.

5. පිටරට බීම විකිණීමේ සම්පූර්ණ අයිතිය ලද්ද වූ බවට කේරි ප්‍රකාශයට පත්කළ පසු ව ටෙන්ඩර්කරු විසින් එදින පස්වරු 4.00 ට පෙර පිටරට බීම විකිණීමේ කොන්දේසි පත් අත්සන් කළ යුතු අතර දෙ මසක බදු මුදලට නො අඩු මුදලක් තැන්පත් ඇප වශයෙන් නුවරඑළිය දිසාපතිට ගෙවිය යුතු ය.

6. කිසියම් කාරණයක් සඳහන් නො කර ටෙන්ඩර් පත්‍රයක් හෝ සියල්ල ම හෝ ප්‍රතික්ෂෙපකිරීමේ අයිතිය දිසාපති සතු වේ.

7. වැඩි විස්තර නුවරඑළිය කච්චේරියෙන් ඉල්ලා සිටිය විට ලබාගත හැක.

පී. එම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූලි 8 වෙනි දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේ දිය.

## උපලේඛනය

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද පිටරට බීම තැබෑරුම් 1969/70

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු පළාත්පාලන ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | ... නුවරඑළිය කඩවත් සතර | ... නුවරඑළිය නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශය | ... පෙ.ව. 8 | ... ප.ව. 7.30 | ... දහවල් 12.00 |
| 2 | ... කොත්මලේ | ... පුණ්ඩලූඔය නගරය තුළ ... | ... පෙ.ව. 8 | ... ප.ව. 7.00 | ... දහවල් 12.30 |

සැලකිය යුතුයි.—1969/70 වර්ෂය සඳහා තැබෑරුම් දැනට පිහිටා ඇති ස්ථානයන් ම ලබාගත හැකි වේ යයි පොරොන්දු නොවන අතර, තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා නුවරඑළිය දිසාපති ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

7–745—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලය තුළ පහත විස්තර සඳහන් අරක්කු තැබෑරුමේ සිල්ලරට අරක්කු විකිණීම සඳහා 1969.6.6 දින හා අංක 14,857 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලට හා පොදුවේ සෑම සුරාබද්ද බලපත්‍රයක් වෙනුවෙන් ම දැනට බලපවත්වන කොන්දේසිවලට යටත්ව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 1 දරන අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 3,000/- ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සිය සමග සෑම ටෙන්ඩරයක්ම, ලබාගත් නියමිත පෝර්මයක ඉදිරිපත් කළ යුතු ය. තව ද, ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි මාලාවේ 4 (3) (1) යන වගන්තිවල ප්‍රකාර නියමයන් අනුව වත්කම් සහතිකයක් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපොල පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු ය.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ම ඉදිරිපත් කළ යුතු ය. නියෝජිතයෙකු මගින් හෝ ලාංකිකයෙකු නොවූ හෝ 1969.6.6 දින හා අංක 14,857 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1969/70 වර්ෂයේ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වෙනි කොන්දේසිය යටතේ නුසුදුසු වූවන්ගේ ටෙන්ඩර් පත්‍ර බාරගනු නොලැබේ.

4. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස් දෙනෙකුට වඩා හවුල්වන ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

5. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරය වම්පස මුදුනේ '' හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 1 දරන අරක්කු තැබෑරුම් රේන්ද සඳහා ටෙන්ඩර් 1969/70 '' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු ය. ටෙන්ඩර් සහිත කවර දිසාපති කායාීලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් 1969 ජූලි මස 31 දින පෙ.ව. 10 ට පෙර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසන වේලාවේදී සියලුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට කච්චේරියට පැමිණ සිටිය යුතු ය. මෙහි 3 වෙනි ඡෙදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වූවහොත් එය සනාථ කිරීමේ ලියවිලි ද රැගෙන පැමිණිය යුතු ය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන්කර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන ලද මුදලක් ගෙවිය යුතුය.

7. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර නියමිත හේතුවක් නොදක්වා ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති වෙත පැවරී ඇත.

8. වැඩි විස්තර හම්බන්තොට කච්චේරියෙන් ලබාගත හැක.

ර. බ. අලවත්තෙගම,
උප දිසාපති,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969 ජූලි මස 10 දින,
හම්බන්තොට කච්චේරියේදී ය.

### 1969–70 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද අරක්කු තැබෑරුම

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම නවත්වන වේලාව | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | ... හම්බන්තොට නගර සහා ප්‍රදේශය | ... හම්බන්තොට නගර සභා සීමාව තුළ | ... පෙ.ව. 10 | ... පෙ.ව. 8 | ... පෙ.ව. 7 |

7–743—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## පුත්තලම් දිස්ත්‍රික්කයේ 1969-70 වර්ෂයේ අරක්කු හා විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

පුත්තලම දිස්ත්‍රික්කයේ අරක්කු හා විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම සම්බන්ධයෙන් මවිසින් 1969. 6. 27 දින අංක 14,860 දරණ ගැසට් පත්‍රයෙහි පළකරවන ලද නිවේදනයට සංශෝධන වශයෙනි.

1. අරක්කු රේන්ද උප ලේඛණයේ සැ. යු. යටතේ, උල්හිටියාව තැබෑරුම සම්බන්ධයෙන් " උල්හිටියාව තැබෑරුම වෙන්නප්පුව සුළු නගර සභා සීමාව තුළ පිහිටුවීමට බලය දෙනු නොලැබේ" යනුවෙන් සඳහන් විය යුතුය.

2. විදේශීය මත්පැන් තැබෑරුම් කොන්දේසි 1969. 6. 20 දින අංක 14,859 දරණ ගැසට් පත්‍රයේ පළවූ බවට සංශෝධනය විය යුතුය.

ඇම්. ඩබ්. ඇස්. ගුණරත්න,
පුත්තලමේ දිසාපති.

1969 ජූලි 9 දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දී ය.

7-762—69.7.18 දින අංක 14,863 දරණ ගැසට් පත්‍රය

---

## 1969-70 වර්ෂය තුලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් නැවත විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පිහිටි පහත සඳහන් තැබෑරුමේ සිල්ලරට පැසුණු රා විකිණීමේ සම්පූර්ණ බලතල මිලදී ගැනීම සඳහා 1969.5.22 දින අංක 14,855 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මවිසින් පළ කරන ලද අනුරාධපුර රා තැබෑරුම විකිණීමේ දැන්වීමෙහි පහත සඳහන් නීතිරීති වලට අනුකූලව ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. 1969 අගෝස්තු මස 13 වැනි දින පෙ.ව. 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු කොටස | විවෘත කරන වේලාව | වසන වේලාව |
|---|---|---|---|---|
| 1 | ... අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය | ... අංක 1 දරන කොටස (මාර්කට්) නව නගරය | ... පෙ.ව. 8 | ... ප.ව. 7 |

අයිවන් සමරවික්‍රම,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969.7.3 වැනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දීය.

7-609—69.7.18 දින අංක 14,863 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි